**2018**




# වාර්ෂික කාර්ය සාධන වාර්තාව

# வருடாந்த செயற்றிறன் அறிக்கை

# Annual Performance Report

රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව
அரசாங்க தகவல் திணைக்களம்
**Department of Government Information**

# වාර්ෂික කාර්ය සාධන වාර්තාව

# வருடாந்த செயற்றிறன் அறிக்கை

# Annual Performance Report

# 2018

## රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව

## அரசாங்க தகவல் திணைக்களம்

## Department of Government Information

# වාර්ෂික කාර්ය සාධන වාර්තාව

# 2018

## රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව

**නො.163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ,**

**කොළඹ 05.**

**“රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තු කාර්යභාරයේ**

**2018 ජනවාරි මස 01 දින සිට 2018 දෙසැම්බර් 31 දින දක්වා**

**වර්ෂයේ කාර්ය සාධනයයි”**

## දැක්ම

*"නිදහස් හා වගකීමෙන් යුතු මාධ්‍ය සම්ප්‍රදායක් උදෙසා දායක වීම"*

## මෙහෙවර

*"ශ්‍රී ලාංකේය සන්නිවේදන මාධ්‍ය අතර සුහදශීලි පරිසරයක් නිර්මාණය කිරීම හා මාධ්‍ය සංස්කෘතිය නඟා සිටුවීම සඳහා අවශ්‍ය මෙහෙයවීම සිදුකරමින් නිවැරදි තොරතුරු හා රජයේ දැක්ම දැන ගැනීමට ඇති අයිතිය තහවුරු කිරීම"*

## අරමුණු

- රාජ්‍ය ප්‍රතිපත්ති හා සංවර්ධන ක්‍රියාදාම ඇතුළුව ජාතික වැදගත්කමකින් යුතු කාලීන ක්‍රියාකාරකම් පිළිබඳ මහජනතාව දැනුවත් කිරීම
- උසස් මාධ්‍ය සංස්කෘතියක් ගොඩනැගීම
- වෘත්තීය ජනමාධ්‍ය සංස්කෘතියක් ගොඩනැගීමට අනුබලදීම හා නායකත්වය සැපයීම
- ඉහත අභිමාර්ථ සපුරා ගැනීම සඳහා මානව හා භෞතික සම්පත් සංවර්ධනය කිරීම
- ගෝලීය තාක්ෂණ ප්‍රවණතාවයන්වලට අනුගත වෙමින් (ඩිජිටල්කරණය) තොරතුරු තාක්ෂණය, ගෝලීය ප්‍රවණතාවයන්ට අනුකූලව කළමනාකරණය කිරීම

## පටුන


| | | පිටු අංකය |
|---|---|---|
| | මෙතෙක් ආ ගමන් මඟ 1948 – 2018 | 01 - 08 |
| | රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ කාර්යභාරය | 09 - 10 |
| | හැඳින්වීම හා අරමුණු | 09 |
| | ප්‍රධාන ක්‍රියාකාරකම් | 10 |
| 01. | පරිපාලන අංශය | 11 - 22 |
| | 1.1 හැඳින්වීම | |
| | 1.2 කාර්ය මණ්ඩලය | |
| | 1.3 2018 වර්ෂයේ කාර්ය මණ්ඩලයේ වෙනස්වීම් | |
| | 1.4 දෙපාර්තමේන්තු විභාග - 2018 | |
| | 1.5 විදේශ ශිෂ්‍යත්ව හා විදේශ ගමන් - 2018 | |
| 02. | මූල්‍ය අංශය | 23 - 31 |
| | 2.1 හැඳින්වීම | |
| | 2.2 2018 වර්ෂය තුළ මුදල් වෙන් කිරීම් සහ වැය කිරීම් | |
| | 2.3 විගණන විමසුම් | |
| 03. | ප්‍රචාරක අංශය | 32 - 35 |
| 04. | සංවර්ධන අංශය | 36 - 37 |
| 05. | නව මාධ්‍ය ඒකකය | 38 - 41 |
| 06. | දෙසතිය අංශය | 42 - 43 |
| 07. | ඡායාරූප අංශය | 44 - 46 |
| 08. | රජයේ චිත්‍රපට අංශය | 47 - 63 |
| 09. | දිස්ත්‍රික් මාධ්‍ය ඒකකය | 64 - 72 |
| 10. | මාධ්‍ය හැඳුනුම්පත් අංශය | 73 |
| 11. | රජයේ ප්‍රකාශන කාර්යාංශය | 74 - 75 |

## මෙතෙක් ආ ගමන් මඟ ....... (1948 – 2018)

බ්‍රිතාන්‍ය යටත් විජිතවාදී පාලන සමයේ දෙවන ලෝක යුද්ධ කාල පරිච්ඡේදයේදී යුද තොරතුරු පිළිබඳව ජනතාව දැනුවත් කිරීම සඳහා “War Information Centre” ක්‍රියාත්මක විය.

ලෝක යුද්ධය නිමාවීමත් සමඟ එම යුධ තොරතුරු ලබා දීමේ මධ්‍යස්ථානය, රජයේ සංවර්ධන කාර්යභාරය පිළිබඳව ජනතාව දැනුවත් කිරීම සඳහා “රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව” නමින් අලුත් ආයතනයක් ලෙස ස්ථාපිත කිරීමට පියවර ගෙන තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස 1948 ජූලි මස 31 වැනිදා සෝල්බරි කොමිෂන් සභාවේ උපදෙස් හා නිර්දේශ මත කොළඹ ගාලු මුවදොර මහලේකම් කාර්යාල සංකීර්ණයේ පළමු වතාවට රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව ස්ථාපිත කරන ලදි. ආරම්භයේදී රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව,

1. ප්‍රවෘත්ති සැපයීම් අංශය
2. ආණ්ඩුවේ පොත්පත් ආයතනය සහ
3. ආණ්ඩුවේ චිත්‍රපට අංශය යන අංශ තුනෙන් සමන්විත විය.

මේ අනුව රජය ඉටු කරනු ලබන ජාතික සංවර්ධන කාර්යභාරය ජනතාව අතරට ගෙන යාම සඳහා ප්‍රධාන කාර්යයන් තුනක් මුල් කරගෙන, ප්‍රධාන අංශ තුනක් යටතේ ස්ථාපිත කල රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ ආයතන ව්‍යුහය බවට පත් වූයේ,

01. රජයේ සංවර්ධන ප්‍රවෘත්ති හා ප්‍රචාරක කටයුතු මෙහෙය වීම
02. රජයේ ප්‍රකාශන කාර්යාංශය මඟින් රජයේ නිල ප්‍රකාශන ජනතාව අතරට ගෙන යාම (මුද්‍රණය කිරීම හා බෙදා හැරීම)
03. රජය විසින් ඉටු කරනු ලබන ජාතික සංවර්ධන කාර්යභාරය පිළිබඳව ගම් මට්ටමින් ජනතාව දැනුවත් කිරීම සඳහා රජයේ චිත්‍රපට අංශය මඟින් වාර්තා චිත්‍රපට නිපදවා ප්‍රදර්ශනය කිරීම

ගාලු මුවදොර මහලේකම් කාර්යාල සංකීර්ණයේ සිට ආයතනයේ එක්, එක් අංශ වරින්වර, තැනින් තැන ස්ථාපිත කර තිබේ. ඒ අතර ජාවත්ත වාරිමාර්ග දෙපාර්තමේන්තු ගොඩනැගිල්ල, මොරටුව පොල්වත්තේ වෙලෝනා ගොඩනැගිල්ල, කොටුව ට්‍රාන්ස්වර්ක් මන්දිරය, ශ්‍රීමත් බාරොන් ජයතිලක මාවත - අතපත්තු ගොඩනැගිල්ල දැක්විය හැකිය. 90 දශකයේ දී කොල්ලුපිටිය පෞද්ගලික

ගොඩනැගිල්ලක මහල් දෙකක පවත්වාගෙන ගිය දෙපාර්තමේන්තුව එවකට රජයේ චිත්‍රපට අංශය පවත්වා ගෙන ගිය පොල්හේන්ගොඩ පරිශ්‍රයට ගෙනැවිත් තිබේ. එතැන් සිට එම පරිශ්‍රයේ නව ගොඩනැගිලි ඉදිකරමින් ආයතනයේ විවිධ අංශ එකම පරිශ්‍රයකට ගෙන ඒමට ආයතන ප්‍රධානීන් කටයුතු කර ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස මනා සේවයක් ඉටුකිරීම සඳහා කාර්ය මණ්ඩලයට ලබා දෙන ත්‍යාගයක් ලෙස එම පරිශ්‍රයේම ආයතනයේ යටිතල පහසුකම් සවිමත් කරමින් ඉදිකරන ලද පස් මහළින් සැදි නව මාධ්‍ය සංවර්ධන මධ්‍යස්ථානයට 2012 මාර්තු 30 වැනිදා සුභ මොහොතින් ගෙවදින ලදි.

වර්තමානයේ රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල් ධූරය දක්වා ආයතන ප්‍රධානියාගේ තත්වය උසස් වී ඇති නමුත් ආරම්භයේදී එම තනතුර ප්‍රවෘත්ත්‍යාධිකාරී නම් විය. 1948 ආරම්භක ප්‍රවෘත්ත්‍යාධිකාරී වූයේ පී.නඩේශන් මහතාය. ප්‍රවෘත්ත්‍යාධිකාරී, ප්‍රවෘත්ති අධ්‍යක්ෂ හා ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල් දක්වා ආයතන ප්‍රධානී තනතුර උසස් වී තිබේ.

මෙකී කාර්යභාරය ඉටු කිරීම සඳහා පළපුරුදු, දක්ෂ ජනමාධ්‍යවේදියෙකු මෙන්ම පුවත්පත් කතුවරයෙකු වූ එච්.ඒ.ජේ.හුළුගල්ල මහතා රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ප්‍රවෘත්ති නිලධාරියා ලෙස පත් කරනු ලැබීය. එසේම සහකාර ප්‍රවෘත්ති නිලධාරීන් ලෙස පී.එන්.මැද්දේගොඩ, එල්.ආර්.ගුණතිලක, එස්.පී.වෙත්තසිංහ, පී.බී.විජේසිංහ යන මහත්වරුන් කටයුතු කර තිබේ.

ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ප්‍රකාශයක් වන “දෙසතිය” සඟරාව මුද්‍රණද්වාරයෙන් එළිදැක්වීම එවකට රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම්ධූරය දැරූ ජ්‍යෙෂ්ඨ අමාත්‍ය, ආචාර්ය සරත් අමුණුගම මහතාගේ සංකල්පයක් මත 1978 පෙබරවාරි 4 වැනිදා “දෙසතිය” සඟරාවේ මංගල කලාපය නිකුත් කිරීමත් සමග ආරම්භ වන්නේ ශ්‍රී ලාංකේය ජනසන්නිවේදන මාධ්‍යයේ හැරවුම් ලක්ෂයක් ලෙසය. එය යුග ගණනාවක් පසු කරමින් තීරණාත්මක සන්ධිස්ථාන පසුකර අඛණ්ඩව ජන මනස පෝෂණය කරමින් සිටින මුද්‍රිත මාධ්‍යයකි.

“සක්වල අතැඹුලක්” කළ දෙසතිය විසින් පෝෂණය වූ ලේඛක පරම්පරාවන් බොහෝය. පාඨක පරම්පරාව ද බොහෝය. මෙරට ප්‍රතිපත්ති තීන්දු කරන්නාගේ සිට ගොවියා, කම්කරුවා දක්වා නියෝජනය කරන ශ්‍රී ලංකාවේ රාජ්‍ය අංශයෙන් ක්‍රියාත්මක කළ එකම පුවත් සඟරාව වන්නේ ද “දෙසතිය” යි. විශේෂයෙන්ම රජයේ ප්‍රතිපත්ති, සංවර්ධන වැඩපිළිවෙල ජනතාගත කිරීමේ ප්‍රධාන වගකීම උරට ගත් දෙසතිය ඉන් ඔබ්බට ගොස් ජන මනසේ බුද්ධිමය විප්ලවයක් ඇති කිරීමට සමත් වෙයි. සමාජීය, ආර්ථික, සංස්කෘතික, කලා, ජාත්‍යන්තර සහ තවත් බොහෝ ක්ෂේත්‍රයන් පිළිබඳ තොරතුරු ඉතාමත් සරල බස් වහරක් යොදා ගනිමින් පාඨක රුචිය වඩවන ලෙස ඉදිරිපත් කිරීමට දෙසතිය සඟරාව සමත් වී තිබේ.

දෙසතියට අමතරව "තොරතුරු" නමින් සතිපතා පුවත්පතක් ද, "Alliance" නමින් ඉංග්‍රීසි පුවත්පතක් ද එකල පල කර තිබේ.

ඉතා සුළු කාර්ය මණ්ඩලයක් යටතේ ආරම්භ කළ රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ 2018 වර්ෂය අවසානය වන විට ස්ථිර, කොන්ත්‍රාත් හා දෛනික සේවාවන්හි නිරතව සිටින සේවක සංඛ්‍යාව 235ක් විය.

රජයේ ආයතන අතර ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව සුවිශේෂී වැදගත්කමක් දරන ආයතනයක් වන්නේ එය සෘජුවම මහජනතාවට පුවත් සපයන මාධ්‍ය ආයතන සමඟ සම්බන්ධ වන ආයතනය වන බැවිනි. ඉන් නිකුත් කෙරෙන නිවේදනයක් රජයේ නිවේදනයක් වන්නා සේම එය අතිශයින් නිවැරදි තොරතුරුවලින් සමන්විත විය යුතුමය.

එසේ පුවත් සපයන අතර එක්, එක් වකවානුවලදී රජය ගන්නා තීරණ අනුව කටයුතු කිරීමට ද සිදු වී ඇත. 1979, 1980, 1981, 1983,1987,1995,1996 හා 2000 යන වර්ෂවලදී රජය පුවත් වාරණය සිදු කළ අතර එම අවස්ථාවල රටේ කලබලකාරී වාතාවරණයක් පැවතීම ඊට හේතු විය. එවැනි අවස්ථාවලදී පුවත් වාරණය කිරීම රජයේ නිසි බලධරයා ලෙස ප්‍රවෘත්ති අධ්‍යක්ෂවරයාට පැවරුණු රාජකාරියක් විය.

1993 දී රූපවාහිනී නාලිකාවන්ට ප්‍රථම වරට ප්‍රවෘත්ති ප්‍රචාරය කිරීමට රජය අවසරදීම මෙරට මාධ්‍ය ඉතිහාසයේ වැදගත් සිදුවීමක් ලෙස සැලකිය හැකි වේ. මීට සමගාමීව මහජනයාට අවශ්‍ය තොරතුරු පහසුවෙන් ලබා ගැනීම සඳහා 1995 මැයි 18 වැනිදා ජාතික තොරතුරු මධ්‍යස්ථානය බිහි කිරීම රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ තවත් එක් ඉදිරි පියවරක් විය. එම මධ්‍යස්ථානය කොළඹ කොටුව, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරයේ ආරම්භ කෙරිණි. ඒ සමඟම මාධ්‍යවේදීන් අතර සුහදත්වය වර්ධනය කිරීම සඳහා "Press Club" එහි පිහිටුවන ලදි.

ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරයෙන් දෙපාර්තමේන්තුව හදිසියේ ඉවත් කරන ලද අතර පසුව කොල්ලුපිටියේ පෞද්ගලික ගොඩනැගිල්ලක මහල් දෙකකට ආයතනය ගෙන ගොස් තිබේ.

රාජ්‍ය ජනමාධ්‍ය ව්‍යුහයේ පැවැති සීමාකම් හඳුනාගෙන ජනතාව වඩාත් සංවර්ධන කාර්යභාරයට දායක කර ගැනීම රජයේ අරමුණ වූයෙන්, විශේෂයෙන් රජයේ කෘෂිකාර්මික නවෝදය, ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කිරීම, සර්වජන ඡන්ද බලයේ ජනතා මෙහෙවර යනාදී කරුණු පිළිබඳව ජනතාව දැනුවත් කිරීමේදී රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවට පැවරුණු වගකීම් වඩාත් සාර්ථකව ඉටු කිරීමට රජයේ චිත්‍රපට අංශය, ප්‍රකාශන කාර්යාංශය ඉතා පුළුල් මෙහෙවරක් එදා යුගයේදී ඉටු කර තිබේ.

ආරම්භක යුගයේ සිටම රජයේ ප්‍රචාරන වැඩපිළිවෙළ දේශීය වශයෙන් පමණක් නොව ජාත්‍යන්තර වශයෙන් ද ඉටු කළ රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකාවේ විදේශ තානාපති කාර්යාල ඉලක්ක කර ගෙන අත්පත්‍රිකා, සඟරා හා ප්‍රකාශන නිතිපතා බෙදා හැරීමට ද කටයුතු කර තිබේ. මෙම කාල පරිච්ඡේදයේදී විදේශ තානාපති කාර්යාල ඉලක්ක කර ගෙන පළ කරනු ලැබූ "Week Happening in the Island" සඟරාව ද "Introduction Ceylon" ආදී ප්‍රකාශන තුළින් ශ්‍රී ලංකාව පිළිබඳව විශේෂ තොරතුරු විදේශ රටවලට ලබා දීමට කටයුතු කර තිබේ. පසු කාලයේදී ශ්‍රී ලංකාව පිළිබඳ තොරතුරු විදේශයන්හි ප්‍රචාරය කිරීම සඳහා "Sri Lanka Today" නමින් ත්‍රෛමාසික සඟරාවක් ද පළ කර තිබේ.

රජයේ ප්‍රකාශන කාර්යාංශය ද ඉතා පුළුල් අරමුණක් යටතේ පවත්වාගෙන යමින් රජයේ නිල ප්‍රකාශන පිළිබඳව නීති, අණපනත් මහජනතාවට මිලදී ගැනීම සඳහා මුද්‍රණය කර බෙදා හැරීමට කටයුතු කර තිබේ. මෙහි ආරම්භක නිලධාරියා ලෙස සේවය කර ඇත්තේ R.V.H.Vantwest මහතාය.

ජුලියෝ පෙට්‍රෝනි මහතාගෙන් ආරම්භ වූ රජයේ චිත්‍රපට අංශය, නිදහසින් පසු මෙරට සිදු වූ ජාතික සංවර්ධනය පිළිබඳව මහජනතාව දැනුවත් කිරීම සඳහා සුවිශාල මෙහෙවරක් ඉටු කර ඇත. ඒ වාර්තා චිත්‍රපට නිෂ්පාදනය මගිනි. පසුකාලීනව කීර්තිමත් වාර්තා චිත්‍රපට අධ්‍යක්ෂවරුන් රාශියක් බිහි කළ මෙම අංශය, පැරිස් ජාත්‍යන්තර චිත්‍රපට උළෙල ආදී විදේශ සිනමා සම්මාන උළෙලවල් රාශියක දී වාර්තා හා අර්ධ වාර්තා අංශයෙන් ශ්‍රී ලංකාවට සම්මාන දිනා දී ඇත.

1948 නිදහසත් සමඟ ඇති කරන ලද දෙපාර්තමේන්තු ආකෘතිය යටතේ යාහැකි උපරිමය දක්වා යන, සිය ගමන් මගේ එදාට වඩා පසුගිය වර්ෂවල නවීන ලෝකයට ගැලපෙන ආකාරයෙන් සංවිධිත වී ඇති රජයේ ප්‍රවාත්ති දෙපාර්තමේන්තුව 2018 වන විට අංශ කිහිපයකින් සිය සේවාවන් පවත්වා ගෙන යනු ලැබේ. රජයේ චිත්‍රපට අංශය, ඡායාරූප අංශය, මධ්‍යම තොරතුරු ඒකකය, දෙසතිය සඟරා අංශය, විශේෂ මාධ්‍ය ඒකකය (www.news.lk), රජයේ ප්‍රකාශන කාර්යාංශය, මාධ්‍ය හැඳුනුම්පත් අංශය, ප්‍රචාරක අංශය සහ පර්යේෂණ හා විමර්ශන අංශවලින් සමන්විත ප්‍රකාශන හා ප්‍රචාරක අංශයන්ගෙන් රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව ක්‍රියාකාරී ආයතනයක් බවට මේ වන විට පත් වී ඇත.

මෙම කාර්යභාරය කාලීන වෙනස්කම්වලට ලක් වෙමින් වර්තමානය දක්වාම සාර්ථකව ක්‍රියාත්මක කිරීමට රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව යුහුසුළු වනවාක් මෙන්ම පවත්නා යාන්ත්‍රණයන් තුළින් ඒ සඳහා ඉඩ හසර වෙන් කර ගන්නා බවද නිරීක්ෂණයේදී පැහැදිලි වේ.

## *රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ ආයතන ප්‍රධානීන් ...............................*

1948 සිට රජයේ ප්‍රවාත්ති දෙපාර්තමේන්තුවේ ආයතන ප්‍රධානීන් ලෙස ප්‍රවෘත්තාධිකාරී, ප්‍රවෘත්ති අධ්‍යක්ෂ සහ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල් යන තනතුරු නාම දරමින් පහත නිලධාරීන් කටයුතු කර ඇත.

| | | |
|---|---|---|
| 1948 | - | පී.නඩේශන් මහතා |
| 1949 | - | ඩී.අයි.එච්.ඒ.ජේ.හුළුගල්ල මහතා |
| 1950 | - | වී.ටී.ආර්.විවියන් හොරයින් මහතා |
| 1952 | - | ඩී.අයි.එච්.ඒ.ජේ.හුළුගල්ල මහතා |
| 1955 | - | නඩේශන් පරරාජශිංගම් මහතා |
| 1956 | - | ජී.ලයනල් පෙරේරා මහතා |
| 1957 | - | ජී.ඩබ්.ඒ.එම්.පෙරේරා මහතා |
| 1958 | - | ජේම්ස් පෙරේරා මහතා |
| 1959 | - | ටී.එම්.ජයරත්නම් මහතා |
| 1960 | - | තිලක් එරංග ගුණරත්න මහතා |
| 1961 | - | ඩබ්.එල්.ප්‍රනාන්දු මහතා |
| 1962 | - | එස්.බී.සේනානායක මහතා |
| 1966 | - | ඩී.අළුවිහාරේ මහතා |
| 1967 | - | පී.එන්.මැද්දේගොඩ මහතා |
| 1968 | - | ආචාර්ය එස්.එල්.බී.අමුණුගම |
| 1972 | - | පී.එච්.ප්‍රේමවර්ධන මහතා |
| 1974 | - | ඩබ්.ආර්.පී.තිලකරත්න මහතා |
| 1977 | - | එස්.අනුර ගුණසේකර මහතා |
| 1983 | - | මානෙල් අබේරත්න මහත්මිය |
| 1990 | - | කේ.එස්.විමලසේන මහතා |
| 1991 | - | කේ.ආර්.එල්.විජේවර්ධන මහතා |


| | | |
|---|---|---|
| 1992 | - | මහාචාර්ය සුනන්ද මද්දුමබණ්ඩාර |
| 1994 | - | ආරිය රූබසිංහ මහතා |
| 2003 | - | කේ.ඒ.බී.ජේ.පී.ජයසේකර මහතා |
| 2004 | - | ඩබ්.එම්.පියසේන මහතා |
| 2005 | - | කාන්ති විජේතුංග මහත්මිය |
| | | එස්.ඩී.පියදාස මහතා |
| 2006 | - | වී.පී.කේ.අනුෂ පැල්පිට මහතා |

*ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්වරුන් ......................*

| | | |
|---|---|---|
| 2009.02.01 සිට 2010.05.06 දක්වා | - | වී.පී.කේ.අනුෂ පැල්පිට මහතා |
| 2010.05.07 සිට 2015.01.08 දක්වා | - | මහාචාර්ය ආරියරත්න ඇතුගල |
| 2015.01.13 සිට 2015.05.07 (වැ.බ.) | - | කේ.ඩබ්.ටී.එන්.අමරතුංග මහත්මිය |
| 2015.05.08 සිට 2017.06.02 | - | ආචාර්ය දර්ශනී ගුණතිලක |
| 2016.06.06 සිට 2017.09.29 දක්වා | - | ආචාර්ය රංග කලන්සූරිය |
| 2017.10.13 සිට 2018.10.26 | - | නීතිඥ සුදර්ශන ගුණවර්ධන මහතා |
| 2018.10.27 සිට මේ දක්වා | - | නාලක කලුවැව මහතා |




ශ්‍රීමත් බාරොන් ජයතිලක මාවතේ දෙපාර්තමේන්තුව



***කොටුව ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය***




*රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ පිවිසුම් මඟ*




*නව මාධ්‍ය සංවර්ධන මධ්‍යස්ථාන ගොඩනැගිල්ල*

## ---------- රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ කාර්යභාරය -----------

රාජ්‍ය ප්‍රතිපත්ති, රජයේ සංවර්ධන ක්‍රියාදාමය ඇතුළුව ජාතික වැදගත්කමකින් යුතු කාලීන ක්‍රියාකාරකම් සහ ජනතාව වෙනුවෙන් රජය මගින් ඉටු කරනු ලබන කාර්යභාරය පිළිබඳව මහජනතාව දැනුවත් කිරීම මෙම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන වගකීම හා කාර්යභාරය වන අතර ගෝලීය තාක්ෂණ ප්‍රවණතාවයන්වලට අනුගත වෙමින් තොරතුරු තාක්ෂණ ක්‍රියාවලිය කළමනාකරණය කර, නිදහස් හා වගකිව යුතු උසස් මාධ්‍ය සංස්කෘතියක් ගොඩනැගීම සඳහා අනුබල දීම හා නායකත්වය සැපයීම ද ප්‍රධාන අභිමතාර්ථයන් වේ.

මෙකී කාර්යභාරය සාක්ෂාත් කරගනු වස්, දෙපාර්තමේන්තුව සිය කාර්යමණ්ඩලය මෙහෙයවන අතර එහිදී එකී නිලධාරීන්ට සිය වගකීම් ඉටු කර ගැනීමට අවශ්‍ය කරන දැනුම, හැකියාව හා පරිසරය සකස් කර දෙනු ලබයි.

මේ තුළ වැඩි අවධානයක් දෙපාර්තමේන්තුව පිහිටුවීමේ අරමුණ කෙරෙහි යොමු කෙරෙන අතර, දෙපාර්තමේන්තුවේ සියළුම අංශ එකී අරමුණ සාක්ෂාත් කර ගැනීම පිණිසම ක්‍රියාත්මක වේ.

### භූමිකාව හා අරමුණු

රජයේ සංවර්ධන පුවත් ජනතාව වෙත සම්ප්‍රේෂණය කිරීමේ භූමිකාව මෙන්ම ඒ හා ඈඳුනු තවත් අරමුණු සාක්ෂාත් කර ගනු වස් ක්‍රියාත්මක රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව, ඒ වෙනුවෙන් විවිධ ක්‍රියාකාරකම් සිය සැලසුම් තුළ අන්තර්ගත කර වසර මුලදී එකී සැලසුම් සඳහා අමාත්‍යාංශ අනුමැතිය ලබා ගනී.

ඉන් අනතුරුව වසර පුරා එකී සැලසුම් ක්‍රියාත්මක කිරීම දැකිය හැකි අතර එසේ සාක්ෂාත් කර ගැනීමට වෙර දරන **අරමුණු** මූලික වශයෙන් පහත පරිදි පෙළගැස්විය හැක.

- ප්‍රමිතිගත මාධ්‍ය සම්ප්‍රදායක් ඇති කිරීම
- තොරතුරු දැන ගැනීමේ අයිතිය ප්‍රවර්ධනය කිරීම සඳහා රජයේ සංවර්ධන ප්‍රචාරණ වැඩපිළිවෙල පිළිබඳ තොරතුරු ජනතාව වෙත ගෙන යාම
- මාධ්‍ය විමර්ශන ක්‍රියාවලිය ශක්තිමත් කිරීම
- යහපාලනය, සංහිඳියාව, තිරසාර සංවර්ධනය ස්ථාපිත කරමින් ප්‍රකාශනයේ හා භාෂණයේ නිදහස තහවුරු කිරීම

- මාධ්‍ය ක්ෂේත්‍රයට අදාළ පර්යේෂණ කටයුතු, සංවර්ධන හා සැලසුම් ඇති කිරීම

## ප්‍රධාන ක්‍රියාකාරකම්

ඉහත භූමිකාව හා අරමුණු සාක්ෂාත් කරගනු වස්, දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරනු ලබන ප්‍රධාන ක්‍රියාකාරකම් පහත පරිදි වර්ග කළ හැක.

- අනෙකුත් අමාත්‍යාංශ විසින් ඉටු කරනු ලබන කාර්යයන්ට අදාල දැනුවත් කිරීමේ වැඩසටහන් (මාධ්‍යවේදීන්, පාසල් සිසුන්, මාධ්‍ය ලේකම්වරුන් හා අනෙකුත් පාර්ශව)
- මාධ්‍ය සාකච්ඡා සංවිධානය කිරීම (කැබිනට් තීරණ දැනුම් දීමේ මාධ්‍ය සාකච්ඡාව හා වෙනත් අමාත්‍යාංශ හා ආයතන කාර්යභාරයට අදාලව)
- ප්‍රවෘත්ති නිවේදන නිකුත් කිරීම
- මාධ්‍ය නිරීක්ෂණ වාරිකා සංවිධානය කිරීම
- සංවර්ධන වැඩසටහන් පිළිබඳ ලිපි හා ප්‍රකාශන ප්‍රකාශයට පත් කිරීම
- නව මාධ්‍ය යොදාගෙන සංවර්ධන වැඩසටහන් පිළිබඳ ප්‍රචාරණය ලබා දීම (Face Book, You Tube, Twitter etc….)
- දෙස් විදෙස් මාධ්‍යවේදීන් සඳහා මාධ්‍ය හඳුනුම්පත් නිකුත් කිරීම
- දෛනික විමර්ශන වාර්තා සකස් කිරීම හා අවශ්‍යතාවය මත අදාල අංශ දැනුවත් කිරීම
- කාලීන වශයෙන් වැදගත් මාතෘකා හා මාධ්‍ය ක්ෂේත්‍රයේ නව ප්‍රවණතා සම්බන්ධයෙන් පර්යේෂණ කිරීම හා වාර්තා ඉදිරිපත් කිරීම
- වාර්තා චිත්‍රපට නිෂ්පාදනය හා ප්‍රචාරය
- ජාතික උත්සව හා සංරක්ෂණය කළ යුතු අවස්ථාවන් ආවරණය හා එකී අවස්ථා ඡායාරූප ගැනීම, සංරක්ෂණය

# 01. පරිපාලන අංශය

## 01.1 හැඳින්වීම :

රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ කාර්යභාරය වනුයේ යහපත් මාධ්‍ය සමාජයක් ගොඩනැගීම සඳහා අවශ්‍ය වන්නා වූ පසුබිම ලාංකේය සමාජය තුළ ස්ථාපිත කිරීමයි. ඒ සඳහා උපයෝගී කර ගනු ලබන ප්‍රතිපත්ති සැකසීම, දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලය පාලනය, අමාත්‍යාංශ සහ අනෙකුත් රාජ්‍ය සහ පෞද්ගලික ආයතන සමග රාජකාරීමය සම්බන්ධතා පවත්වාගෙන යාම පාලන අංශයේ වගකීම් වේ. ඒ අනුව සමස්ථයක් ලෙස ගත් කළ දෙපාර්තමේන්තුවේ සියලුම පරිපාලන කටයුතු මෙහෙයවන ප්‍රධාන අංශය පාලන අංශය වේ.

රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්තුමා වෙත ඍජුව වගකීමට බැඳෙන, අධ්‍යක්ෂ (පාලන), සහකාර ප්‍රවෘත්ති අධ්‍යක්ෂ, රාජ්‍ය කළමනකරණ සහකාර සහ කාර්යාල කාර්ය සහායක දෙදෙනෙකුගෙන් යුතු පාලන අංශයේ කාර්යභාරය සංක්ෂිප්ත වශයෙන් පහත පරිදි වේ.

- දෙපාර්තමේන්තුවේ සියලුම අංශයන්හි දෛනික පරිපාලන කටයුතු මෙහෙයවීම
- දෙපාර්තමේන්තුවේ දැක්ම, මෙහෙවර අනුව කාලෝචිතව වෙනස් විය යුතු ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම හා ඊට අනුව වගකීම් නිවැරදිව ඉටු වන්නේද යන්න අධීක්ෂණය සඳහා අවශ්‍ය සමාලෝචන කටයුතු සිදු කිරීම
- දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩල කාර්තු වාර්තා සකස් කිරීම හා අවශ්‍යතාව අනුව ඉල්ලීම් කරනු ලබන ආයතන වෙත ඉදිරිපත් කිරීම
- විගණන විමසුම් සඳහා පිළිතුරු සැපයීම
- දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලයේ සංශෝධන, බඳවා ගැනීම් පටිපාටි සැකසීම හා ඒවායෙහි සංශෝධනයන් අවශ්‍ය පරිදි සිදු කිරීම
- දෛනික තැපැල විධිමත්ව පවත්වාගෙන යාම
- දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලයේ පෞද්ගලික ලිපිගොණු යාවත්කාලීනව පවත්වා ගෙන යාම
- සේවක විනය පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම
- දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලයේ බඳවා ගැනීම්, උසස් කිරීම්, ස්ථාන මාරු කිරීම් හා විශ්‍රාම ගැන්වීමට අදාළ කටයුතු සිදු කිරීම
- දෙපාර්තමේන්තුවේ පවිත්‍රතා කටයුතු හා කාර්යාල පරිශ්‍රයේ ආරක්ෂක කටයුතු පවත්වාගෙන යාම

- දේශීය හා විදේශීය සේවක පුහුණු කටයුතු සම්බන්ධ රාජකාරි
- අතිකාල දීමනා, දෛනික සේවක වැටුප් ගෙවීමට සම්බන්ධ කටයුතු
- කාර්ය මණ්ඩල නිලධාරින්ගේ පැමිණීම, පිටවීම සහ නිවාඩු ගොණු නිසියාකාරව පවත්වාගෙන යාම
- සේවක ණය, ජල - විදුලි බිල්පත්, පුවත්පත් බිල්පත්, දුරකථන බිල්පත් හා වරිපනම් බිල්පත් ගෙවීම සම්බන්ධ රාජකාරි කටයුතු
- අග්‍රහාර සෞඛ්‍ය රක්ෂණ ක්‍රමය හා සම්බන්ධ රාජකාරි කටයුතු
- දෙපාර්තමේන්තුවේ ගබඩාව සම්බන්ධ සියලු කාර්ය සම්බන්ධීකරණය
- ප්‍රවාහන සංචිතය පවත්වා ගෙන යාම සහ දෙපාර්තමේන්තු වාහන නඩත්තුවට සම්බන්ධ කාර්යයන්
- අදාළ විෂයයන් සම්බන්ධයෙන් අවශ්‍යතාවය පරිදි අභ්‍යන්තර චක්‍රලේඛ නිකුත් කිරීම හා මීට අමතරව කාලීන අවශ්‍යතාව මත හඳුනාගනු ලබන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

## 01.2 කාර්ය මණ්ඩලය :

කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක DMS/C/6/44/01-Vol-II හා 2012.08.20 දිනැති ලිපියට අනුව හා අවස්ථාවෝචිත පිරිදි අනුමත කරන ලද කාර්ය මණ්ඩලය දැනට මෙම දෙපාර්තමේන්තුවේ ක්‍රියාත්මක වේ. ඒ අනුව 2017.12.31 දිනට යාවත්කාලීන කරන ලද දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලය පහත පරිදි වේ.

| අනු අංකය | තනතුරු නාමය | අයත් වන සේවය | ශ්‍රේණිය / පන්තිය | වැටුප් කේතය | අනුමත තනතුරු සංඛ්‍යාව | 2017.12.31 දිනට සේවයේ යෙදී සිටි සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|
| 01. | රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල් | ශ්‍රී ලංකා පරිපාලන සේවය | විශේෂ | SL–3-2006 | 01 | 01 |
| 02. | රජයේ අතිරේක ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල් | කොන්ත්‍රාත් පදනම මත | - | - | 01 | - |
| 03. | අධ්‍යක්ෂ (පාලන) | ශ්‍රී ලංකා පරිපාලන සේවය | I | SL–1-2006 | 01 | 01 |
| 04. | අධ්‍යක්ෂ (රජයේ චිත්‍රපට අංශය) | කොන්ත්‍රාත් පදනම මත | - | | 01 | - |
| 05. | ප්‍රධාන ගණකාධිකාරි | ශ්‍රී ලංකා ගණකාධිකාරි සේවය | I | SL–1-2006 | 01 | 01 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 06. | ගණකාධිකාරි | ශ්‍රී ලංකා ගණකාධිකාරි සේවය | III, II | SL–1-2006 | 01 + | 01 |
| 07. | සහකාර / නියෝජ්‍ය ප්‍රවෘත්ති අධ්‍යක්ෂ | ශ්‍රී ලංකා පරිපාලන සේවය | III, II | SL–1-2006 | 03 + | 02 |
| 08. | සහකාර / නියෝජ්‍ය ප්‍රවෘත්ති අධ්‍යක්ෂ | දෙපාර්තමේන්තුගත | III, II | SL–1-2006 | 03 + | 02 |
| 09. | නිෂ්පාදක | දෙපාර්තමේන්තුගත | III, II | SL–1-2006 | 01 + | - |
| 10. | පරිපාලන නිලධාරි | රාජ්‍ය කළමනාකරණ සහකාර සේවය | අධි | MN–7-2006A | 01 | 01 |
| 11. | ඡායාරූප ශිල්පි | ශ්‍රී ලංකා තාක්ෂණ සේවය | විශේෂ | MN–7-2006A | 03 | 01 |
| 12. | තාක්ෂණ නිලධාරි | ශ්‍රී ලංකා තාක්ෂණ සේවය | විශේෂ | MN–7-2006A | 03 | 01 |
| 13. | ජ්‍යෙෂ්ඨ ප්‍රවෘත්ති නිලධාරි | දෙපාර්තමේන්තුගත | III, II, I | MN–7-2006A | 05 | - |
| 14. | තොරතුරු හා සන්නිවේදන නිලධාරි | ශ්‍රී ලංකා තොරතුරු සන්නිවේදන තාක්ෂණ සේවය | 2 පන්තියේ II, I ශ්‍රේණි | MN–6-2006A | 01 | - |
| 15. | භාෂා පරිවර්තක | භාෂා පරිවර්තක සේවය | II, I | MN–6-2006A | 03 | 01 |
| 16. | ප්‍රවෘත්ති නිලධාරි | දෙපාර්තමේන්තුගත | III, II, I | MN–4-2006A | 40 | 37 |
| 17. | සංස්කාරක | දෙපාර්තමේන්තුගත | III, II, I | MN–4-2006A | 03 | - |
| 18. | සංඛ්‍යා ලේඛන හා පර්යේෂණ නිලධාරි | දෙපාර්තමේන්තුගත | III, II, I | MN–4-2006A | 01 * | - |
| 19. | වැඩසටහන් නිලධාරි | වැඩසටහන් නිලධාරි සේවය | III, II, I | MN–4-2006A | 45 | 39 |
| 20. | ඡායාරූප ශිල්පි | ශ්‍රී ලංකා තාක්ෂණ සේවය | III, II, I | MN–3-2006A | 10 | 03 |
| 21. | පුස්තකාලයාධිපති | පුස්තකාලයාධිපති සේවය | III, II, I | MN–3-2006A | 01 | - |
| 22. | තාක්ෂණ නිලධාරි | ශ්‍රී ලංකා තාක්ෂණ සේවය | III, II, I | MN–3-2006A | 10 | 13 |
| 23. | රාජ්‍ය කළමනාකරණ සහකාර | රාජ්‍ය කළමනාකරණ සහකාර සේවය | III, II, I | MN–2-2006A | 35 | 21 |
| 24. | ටයිප් සෙටර් | දෙපාර්තමේන්තුගත | III, II, I | MN–1-2006A | 01 * | 01 |
| 25. | ප්‍රවෘත්ති ලේඛක | දෙපාර්තමේන්තුගත | III, II, I | MN–1-2006A | 02 * | - |
| 26. | සහකාර චිත්‍රපටලයාධිපති | දෙපාර්තමේන්තුගත | III, II, I | MN–1-2006A | 01 | 01 |
| 27. | පිළිගැනීමේ නිලධාරි | දෙපාර්තමේන්තුගත | III, II, I | MN–1-2006A | 01 * | - |
| 28. | චිත්‍රපට ප්‍රදර්ශක | දෙපාර්තමේන්තුගත | III, II, I | MN–1-2006A | 02 | 02 |
| 29. | නෛගටිව් භාරකරු | දෙපාර්තමේන්තුගත | III, II, I | MN–1-2006A | 01 * | 01 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 30. | අලෙවි සහකාර | දෙපාර්තමේන්තුගත | III, II, I | MN–1-2006A | 07 | 05 |
| 31. | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර | ශ්‍රී ලංකා තොරතුරු සන්නිවේදන තාක්ෂණ සේවය | 3 පන්තියේ III, II, I ශ්‍රේණි | MT–1-2006 A | 02 | 01 |
| 32. | තාක්ෂණික සහායක | දෙපාර්තමේන්තුගත | III, II, I | MT–1-2006A | 08 | 01 |
| 33. | මෝටර් කාර්මික | දෙපාර්තමේන්තුගත | III, II, I හා විශේෂ | PL–3-2006A | 01 * | 01 |
| 34. | රියදුරු | ඒකාබද්ධ රියදුරු සේවය | III, II, I හා විශේෂ | PL–3-2006A | 18 | 17 |
| 35. | සම්පාදක කාර්ය සහායක (නඩත්තු) | දෙපාර්තමේන්තුගත | III, II, I හා විශේෂ | PL–2-2006A | 03 | 03 |
| 36. | සම්පාදක කාර්ය සහායක (වීඩියෝ නිපැයුම්) | දෙපාර්තමේන්තුගත | III, II, I හා විශේෂ | PL–2-2006A | 02 | 01 |
| 37. | අඳුරු කාමර ඡායාරූප මුද්‍රණකරු | දෙපාර්තමේන්තුගත | III, II, I හා විශේෂ | PL–2-2006A | 01 * | 01 |
| 38. | කාර්යාල කාර්ය සහායක සේවයේ තනතුරු | කාර්යාල කාර්ය සහායක සේවය | III, II, I හා විශේෂ | PL–1-2006A | 28 | 24 |
| 39. | සහාය සංස්කාරක | කොන්ත්‍රාත් පදනම මත | ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශ මත මාසික දීමනාවක් | | 05 | 01 |
| 40. | අධ්‍යක්ෂ (වෙබ් පරිපාලන) | කොන්ත්‍රාත් පදනම මත | | | 01 | - |
| 41. | වෙබ් සංස්කාරක (සිංහල, දෙමළ, ඉංග්‍රීසි) | කොන්ත්‍රාත් පදනම මත | | | 03 | 03 |
| 42. | වෙබ් ලේඛක (සිංහල, දෙමළ, ඉංග්‍රීසි) | කොන්ත්‍රාත් පදනම මත | | | 09 | 02 |
| | | | | **එකතුව** | **270** | **190** |

+. මෙම තනතුරු අදාළ සේවයේ III හෝ II ශ්‍රේණියේ තනතුරු වේ. සේවක සංඛ්‍යා සීමාවකින් තොරව උසස්වීම් ලබා දෙන බැවින්, I වන ශ්‍රේණියට හෝ විශේෂ ශ්‍රේණියට උසස් වීමෙන් අනතුරුව වුවද, මෙම තනතුරේම රැඳී සිටීමට එම නිලධාරින්ට සිදු විය හැකිය. අනුමත සේවක සංඛ්‍යාව තුළ සේවය කරනු ලබන විට III ශ්‍රේණියේ නිලධාරින් වැඩ බැලීමේ පදනම මත, II ශ්‍රේණියේ තනතුරුවලට පත් නොකළ යුතුය.

*. මෙම තනතුර දරන්නාට පෞද්ගලික වන සේ, පසුව අහෝසි වීමට යටත්ව අනුමත වී ඇත.

එසේම මීට අමතරව අවස්ථාවෝචිත පරිදි, සේවයේ අවශ්‍යතාව මත 2016 - 2018 වර්ෂයේදී මු.රෙ.71 අයදුම්පත්‍ර මගින් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් යම් යම් තනතුරු පහත පරිදි අනුමත කරවා ගෙන ඇත.

I. කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක DMS/C/6/44/01-(Vol-III) හා 2013.09.02 දිනැති ලිපිය මගින් දැනට තනතුර දරන්නාට පෞද්ගලික වන ලෙස අනුමත කර ඇති තනතුරු 05 ද ඇතුළුව තාක්ෂණ නිලධාරි තනතුරු 15ක් සහ තාක්ෂණ නිලධාරි (ගොඩනැගිලි අලුත් වැඩියා හා නඩත්තු) තනතුරු 01ක් ද වශයෙන් තාක්ෂණ නිලධාරි තනතුරු 16ක් මෙම දෙපාර්තමේන්තුව සඳහා අනුමත කර ඇත.

II. කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක DMS/1134 හා 2015.09.10 දිනැති ලිපිය මගින් විමර්ශන නිලධාරි තනතුරු 06 ක් අනුමත කර ඇති අතර ඒත් සමගම මෙම දෙපාර්තමේන්තුව සඳහා විමර්ශන නිලධාරි තනතුරු 30ක් අනුමත වී ඇත.

III. කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක DMS/1134 හා 2016.07.07 දිනැති ලිපිය මගින් අතිරේක අධ්‍යක්ෂ ජනරාල් තනතුර ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ පන්තියේ තනතුරක් ලෙස මෙම දෙපාර්තමේන්තුව සඳහා අනුමත වී ඇත.

IV. කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක DMS/1134/V-I හා 2016.10.11 දිනැති ලිපිය මගින් අධ්‍යක්ෂ (ප්‍රවෘත්ති) - දෙපාර්තමේන්තුගත තනතුර මෙම දෙපාර්තමේන්තුව සඳහා අනුමත වී ඇත.

V. කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක DMS/1134 හා 2014.09.29 දිනැති ලිපිය මගින් වෙබ් සංවර්ධක (වසරක කොන්ත්‍රාත් කාලයක් සඳහා) එක් තනතුරක් මෙම දෙපාර්තමේන්තුව සඳහා අනුමත වී ඇත.

VI. කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක DMS/1134 හා 2016.06.02 දිනැති ලිපිය මගින් ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ කටයුතු ප්‍රතිසංවිධානය කිරීම හේතුවෙන් මෙම දෙපාර්තමේන්තුවට අනුයුක්ත කර සිටි නිලධාරීන් අටදෙනා (08) (සහකාර අධ්‍යක්ෂ (මාධ්‍ය) – 01, ප්‍රවෘත්ති නිලධාරි - 03, නිශ්චල ඡායාරූප ශිල්පි - 02, කැමරා ක්‍රියාකරු (වීඩියෝ) – 01 හා කැමරා සහායක - 01) තනතුර දරන්නාට පමණක් පෞද්ගලික වන සේ මෙම දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලයට ඇතුළත් කර ගැනීම අනුමත කර ඇත.

VII. කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක DMS/C/6/44/01-(Vol-III) හා 2013.09.24 දිනැති ලිපිය මගින් ශ්‍රී ලංකා ගණකාධිකාරි සේවයේ III/II ශ්‍රේණියේ තනතුරක් මෙම දෙපාර්තමේන්තුව සඳහා අනුමත කර ඇත.

VIII. කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක DMS/C/6/44/01-(Vol-III) හා 2013.09.03 දිනැති ලිපිය මගින් රූ රටා සංස්කාරක (කොන්ත්‍රාත් පදනම මත) තනතුරක් මෙම දෙපාර්තමේන්තුව සඳහා අනුමත කර ඇත.

IX. කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක DMS/C/6/44/01-Vol-II හා 2012.10.22 දිනැති ලිපිය මගින් සංවර්ධන නිලධාරි (ප්‍රවෘත්ති) - සංවර්ධන නිලධාරි සේවය තනතුරු 30ක් මෙම දෙපාර්තමේන්තුව සඳහා අනුමත කර ඇත.

ඒ අනුව 2018.01.01 දිනට දෙපාර්තමේන්තුවේ අනුමත තනතුරු සංඛ්‍යාව, සේවයේ යෙදී සිටින සංඛ්‍යාව හා පුරප්පාඩු සංඛ්‍යාව පහත සඳහන් පරිදි වේ.

| අනු අංකය | අනුමත තනතුර | අනුමත සංඛ්‍යාව | සේවයේ යෙදී සිටින සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 01. | රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල් | 01 | 01 | - |
| 02. | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් | 01 | - | 01 |
| 03. | අධ්‍යක්ෂ (පාලන) | 01 | 01 | - |
| 04. | අධ්‍යක්ෂ (ප්‍රවෘත්ති) - දෙපාර්තමේන්තුගත | 01 | - | 01 |
| 05. | අධ්‍යක්ෂ - රජයේ චිත්‍රපට (කොන්ත්‍රාත්) | 01 | - | 01 |
| 06. | ප්‍රධාන ගණකාධිකාරි | 01 | 01 | - |
| 07. | ගණකාධිකාරි | 01 | 01 | - |
| 08. | අභ්‍යන්තර විගණක | 01 | - | 01 |
| 09. | නියෝජ්‍ය/සහකාර ප්‍රවෘත්ති අධ්‍යක්ෂ (ශ්‍රී.ලං.ප.සේ.) | 03 | 01 | 02 |
| 10. | නියෝජ්‍ය/සහකාර ප්‍රවෘත්ති අධ්‍යක්ෂ (ශ්‍රී.ලං.ප.සේ. නොවන) | 03 | 01 | 02 |
| 11. | සහකාර අධ්‍යක්ෂ (මාධ්‍ය) - දෙපාර්තමේන්තුගත | 01 | 01 | - |
| 12. | නිෂ්පාදක | 01 | - | 01 |
| 13. | පරිපාලන නිලධාරි | 01 | 01 | - |
| 14. | ඡායාරූප ශිල්පි (විශේෂ පන්තිය) | 03 | 01 | 02 |

| | | | | |
|---|---|---|---|---|
| 15. | තාක්ෂණ නිලධාරි (විශේෂ පන්තිය) | 03 | 01 | 02 |
| 16. | ජ්‍යෙෂ්ඨ ප්‍රවෘත්ති නිලධාරි | 05 | - | 05 |
| 17. | තොරතුරු හා සන්නිවේදන නිලධාරි | 01 | - | 01 |
| 18. | භාෂා පරිවර්තක | 03 | 01 | 02 |
| 19. | ප්‍රවෘත්ති නිලධාරි | 40 | 37 | 03 |
| 20. | වැඩසටහන් නිලධාරි | 45 | 39 | 06 |
| 21. | ප්‍රවෘත්ති නිලධාරි - දෙපාර්තමේන්තුගත | 03 | 03 | - |
| 22. | සංවර්ධන නිලධාරි | 30 | 26 | 04 |
| 23. | ඡායාරූප ශිල්පි | 10 | 03 | 07 |
| 24. | පුස්තකාලයාධිපති | 01 | - | 01 |
| 25. | තාක්ෂණ නිලධාරි | 16 | 13 | 03 |
| 26. | අඳුරු කාමර ඡායාරූප මුද්‍රණකරු | 01 | 01 | - |
| 27. | නිශ්චල ඡායාරූප ශිල්පි - දෙපාර්තමේන්තුගත | 02 | 02 | - |
| 28. | රාජ්‍ය කළමනාකරණ සහකාර | 35 | 21 | 14 |
| 29. | සහකාර චිත්‍රපටලයාධිපති | 01 | 01 | - |
| 30. | චිත්‍රපට ප්‍රදර්ශක | 02 | 02 | - |
| 31. | අලෙවි සහකාර | 07 | 05 | 02 |
| 32. | විමර්ශන නිලධාරි (විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය) | 30 | 22 | 08 |
| 33. | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර | 02 | 01 | 01 |
| 34. | ටයිප් සෙටර් | 01 | 01 | - |
| 35. | නෙගටිව් භාරකරු | 01 | 01 | - |
| 36. | කැමරා ක්‍රියාකරු (වීඩියෝ) - දෙපාර්තමේන්තුගත | 01 | 01 | - |
| 37. | තාක්ෂණ සහායක | 08 | 01 | 07 |
| 38. | මෝටර් කාර්මික | 01 | 01 | - |
| 39. | රියදුරු | 18 | 17 | 01 |

| | | | | |
|---|---|---|---|---|
| 40. | සම්පාදක කාර්ය සහායක - නඩත්තු | 03 | 03 | - |
| 41. | සම්පාදක කාර්ය සහායක - වීඩියෝ නිපැයුම් | 02 | 01 | 01 |
| 42. | කාර්යාල කාර්ය සහායක | 28 | 22 | 04 |
| 43. | කැමරා සහායක - දෙපාර්තමේන්තුගත | 01 | 01 | - |
| 44. | වෙබ් සංවර්ධක | 01 | - | 01 |
| 45. | රූ රටා සංස්කාරක | 01 | - | 01 |
| 46. | සංස්කාරක | 03 | 01 | 02 |
| 47. | සහාය සංස්කාරක | 05 | 01 | 04 |
| 48. | වෙබ් සංස්කාරක (සිංහල/ දෙමළ/ ඉංග්‍රීසි) | 03 | 03 | - |
| 49. | වෙබ් ලේඛක (සිංහල/ දෙමළ/ ඉංග්‍රීසි) | 09 | 02 | 07 |

## 01.3 2018 වර්ෂයේ කාර්ය මණ්ඩලයේ වෙනස්වීම්

**නව බඳවා ගැනීම් :**

I. 2018.03.15 දින සිට සම්පාදක කාර්ය සහායක (වීඩියෝ නිපැයුම්) තනතුර සඳහා එක් නිලධාරියෙකු (01) බඳවා ගෙන ඇත.

II. 2017.11.01 දින සිට පත්වීම් පෙරදාතම් කර, 2018 වසරේ පළමු කාර්තුවේදී වෙබ් සංස්කාරක (ඉංග්‍රීසි) හා වෙබ් ලේඛක (දෙමළ) තනතුරු සඳහා නිලධාරීන් දෙදෙනෙකු (02) බඳවා ගෙන ඇත.

III. 2018 වසරේ දෙවන කාර්තුවේදී රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ නිලධාරින් දසදෙනෙකු (10) රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය විසින් පත් කර එවා ඇත.

IV. 2018.08.24 දින සිට අතිරේක අධ්‍යක්ෂ ජනරාල් තනතුර සඳහා නිලධාරියෙකු රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය විසින් පත් කර එවා ඇත.

V. 2016.10.11 දින සිට පත්වීම් පෙරදාතම් කර, 2018 වසරේ තෙවන කාර්තුවේදී අධ්‍යක්ෂ (ප්‍රවෘත්ති) තනතුර සඳහා නිලධාරියෙකු බඳවා ගෙන ඇත.

VI. 2018.07.10 දින සිට වෙබ් ලේඛක (දෙමළ) - කොන්ත්‍රාත් තනතුර සඳහා නිලධාරියෙකු බඳවා ගෙන ඇත.

VII. 2018.08.15 දින සිට තාක්ෂණ සහායක තනතුර සඳහා නිලධාරීන් දෙදෙනෙකු (02) බඳවා ගෙන ඇත.

VIII. 2018.11.01 දින සිට සංවර්ධන නිලධාරි සේවයේ නිලධාරියෙකු රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය විසින් පත් කර එවා ඇත.

IX. 2018.10.19 දින සිට රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ නිලධාරින් දෙදෙනෙකු (02) රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය විසින් පත් කර එවා ඇත.

X . 2018.10.02 දින සිට වෙබ් ලේඛක (සිංහල) - කොන්ත්‍රාත් තනතුර සඳහා නිලධාරියෙකු බඳවා ගෙන ඇත.

**විශ්‍රාම යාම් / මිය යාම් :**

I. 2018.01.07 දින සිට ප්‍රවෘත්ති නිලධාරී ලෙස සේවය කළ නිලධාරියෙකු විශ්‍රාම ගොස් ඇත.

II. 2018.03.02 දින සිට ප්‍රවෘත්ති නිලධාරි ලෙස සේවය කළ නිලධාරියෙකු විශ්‍රාම ගොස් ඇත.

III. 2018.03.31 දින සිට අලෙවි සහකාර ලෙස සේවය කළ නිලධාරියෙකු විශ්‍රාම ගොස් ඇත.

IV. 2018.05.13 දින සිට ඡායාරූප ශිල්පි ලෙස සේවය කළ නිලධාරියෙකු විශ්‍රාම ගොස් ඇත.

V. 2018.06.13 දින සිට ප්‍රවෘත්ති නිලධාරී ලෙස සේවය කළ නිලධාරියෙකු විශ්‍රාම ගොස් ඇත.

VI. 2018.07.06 දින සිට ප්‍රවෘත්ති නිලධාරි ලෙස සේවය කළ නිලධාරියෙකු විශ්‍රාම ගොස් ඇත.

VII. 2018.07.07 දින ඡායාරූප ශිල්පි ලෙස සේවය කළ නිලධාරියෙකු මිය ගොස් ඇත.

VIII. 2018.09.08 දින කාර්යාල සේවක සේවයේ නිලධාරියෙකු මිය ගොස් ඇත.

IX. 2018.10.26 දින සිට තාක්ෂණ නිලධාරී ලෙස සේවය කළ නිලධාරියෙකු විශ්‍රාම ගොස් ඇත.

X. 2018.12.13 දින සිට තාක්ෂණ නිලධාරී ලෙස සේවය කළ නිලධාරියෙකු විශ්‍රාම ගොස් ඇත.

**තනතුර අතහැර යාම / සේවයෙන් ඉල්ලා අස්වීම**

I. 2018.03.01 දින සිට කාර්යාල සේවක සේවයේ නිලධාරියෙකු සේවයෙන් ඉල්ලා අස් වී ඇත.

II. 2018.06.18 දින සිට රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ නිලධාරියෙකු සේවයෙන් ඉල්ලා අස් වී ඇත.

III. 2018.06.30 දින සිට වෙබ් ලේඛක - දෙමළ ලෙස කොන්ත්‍රාත් පදනම මත සේවය කළ නිලධාරියෙකු සේවයෙන් ඉල්ලා අස් වී ඇත.

IV. 2018.10.05 දින සිට සහාය සංස්කාරක - දෙමළ ලෙස කොන්ත්‍රාත් පදනම මත සේවය කළ නිලධාරියෙකු සේවයෙන් ඉල්ලා අස් වී ඇත.

V. 2018.12.04 දින සිට වෙබ් ලේඛක - දෙමළ ලෙස කොන්ත්‍රාත් පදනම මත සේවය කළ නිලධාරියෙකු සේවයෙන් ඉල්ලා අස් වී ඇත.

VI. 2018.12.04 දින සිට වෙබ් ලේඛක - දෙමළ ලෙස කොන්ත්‍රාත් පදනම මත සේවය කළ නිලධාරියෙකු සේවයෙන් ඉල්ලා අස් වී ඇත.

## 01.4 දෙපාර්තමේන්තු විභාග - 2018 :

I. 2017.07.14 - රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර - තාක්ෂණික සේවා ගණය (MN 03 - 2016) තාක්ෂණ නිලධාරි (ගොඩනැගිලි අලුත් වැඩියා හා නඩත්තු) විවෘත තනතුරට බඳවා ගැනීමේ තරඟ විභාගය

## 01.5 විදේශ ශිෂ්‍යත්ව හා විදේශ ගමන් - 2018

I. 2018.02.25 දින සිට 2018.03.03 දින දක්වා මැලේසියාවේ පැවැත්වූ “Managerial Competency Development Program” පුහුණුව සඳහා සහකාර ප්‍රවෘත්ති අධ්‍යක්ෂ, පී.වී.සී.සී.පනාවල මහතා සහභාගි වී ඇත.

II. 2018.02.23 දින සිට 2018.12.22 දින දක්වා චීන රජය මගින් පිරිනමන ලද ශිෂ්‍යත්වයක් අනුව “Exchange Program of China” පාඨමාලාව හැදෑරීම සඳහා ප්‍රවෘත්ති නිලධාරි, වයි.ජී. එස්.අයි.බණ්ඩාර මහතා සහභාගි වී ඇත.

III. 2018.05.08 දින සිට 2018.05.16 දින දක්වා ජපානයේ පැවැත්වූ "International Program on Management" පුහුණුව සඳහා ප්‍රධාන ගණකාධිකාරී, එච්.ඒ.යූ.ජයලත් මහතා සහභාගි වී ඇත.

IV. 2018.09.23 දින සිට 2018.09.30 දින දක්වා ස්වීඩනයේ ස්ටොක්හෝම් විශ්වවිද්‍යාලය මගින් පැවැත්වූ පරිගණක ක්‍රමවේද විද්‍යාව පිළිබඳ පුහුණුව සඳහා සහකාර අධ්‍යක්ෂ (මාධ්‍ය), එම්.ඩී.කේ.පී.ආරියවංශ මහතා සහභාගි වී ඇත.

V. 2018.10.27 දින සිට 2018.11.04 දින දක්වා චීනයේ පැවැත්වූ "40$^{th}$ Anniversary of China's Reform & Opening Up" පුහුණුව සඳහා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ සහකාර, ආර්.එම්.සී.පී.කේ.රත්නායක මහතා සහභාගි වී ඇත.

VI. 2018.03.09 දින සිට 2018.03.12 දින දක්වා ජනාධිපති ඉන්දියානු සංචාරයේ මාධ්‍ය ආවරණ කටයුතු වෙනුවෙන් ඡායාරූප ශිල්පී, පී.ඒ.සරත් ධර්මසිරි මහතා සහභාගි වී ඇත.

VII. 2018.03.09 දින සිට 2018.03.12 දින දක්වා ජනාධිපති ඉන්දියානු සංචාරයේ මාධ්‍ය ආවරණ කටයුතු වෙනුවෙන් තාක්ෂණ නිලධාරි, ඩබ්.කුමුදුලාල් වල්පොල මහතා සහභාගි වී ඇත.

VIII. 2018.03.10 දින සිට 2018.03.18 දින දක්වා ජනාධිපති ජපාන සංචාරයේ මාධ්‍ය ආවරණ කටයුතු වෙනුවෙන් තාක්ෂණ නිලධාරි, එල්.ඒ.එල්.සිගේරා මහතා සහභාගි වී ඇත.

IX. 2018.07.12 දින සිට 2018.07.17 දින දක්වා ජනාධිපති ඉතාලි සංචාරයේ මාධ්‍ය ආවරණ කටයුතු වෙනුවෙන් තාක්ෂණ නිලධාරි, එල්.ඒ.එල්.සිගේරා මහතා සහභාගි වී ඇත.

X. 2018.07.15 දින සිට 2018.07.20 දින දක්වා ජනාධිපති ජෝර්ජියා සංචාරයේ මාධ්‍ය ආවරණ කටයුතු වෙනුවෙන් ඡායාරූප ශිල්පී, එම්.එච්.ඩී.සී.පෙරේරා මහතා සහභාගි වී ඇත.

XI. 2018.08.17 දින සිට 2018.08.23 දින දක්වා ඉන්දියානු වෘත්තීය පත්‍ර කලාවේදීන්ගේ සංගමයේ මහා සමුළුව සඳහා ප්‍රවෘත්ති නිලධාරි, ඩබ්.එම්.ශාන්තප්‍රිය මහතා සහභාගි වී ඇත.

XII. 2018.08.17 දින සිට 2018.08.23 දින දක්වා ඉන්දියානු වෘත්තීය පත්‍ර කලාවේදීන්ගේ සංගමයේ මහා සමුළුව සඳහා ප්‍රවෘත්ති නිලධාරි, ඩී.එස්.පී.මායාදුන්නේ මහතා සහභාගි වී ඇත.

XIII. 2018.08.17 දින සිට 2018.08.23 දින දක්වා ඉන්දියානු වෘත්තීය පත්‍ර කලාවේදීන්ගේ සංගමයේ මහා සමුළුව සඳහා ප්‍රවෘත්ති නිලධාරි, ජේ.එච්.ශ්‍රියාණි මිය සහභාගි වී ඇත.

XIV. 2018.08.17 දින සිට 2018.08.23 දින දක්වා ඉන්දියානු වෘත්තීය පත්‍ර කලාවේදීන්ගේ සංගමයේ මහා සමුළුව සඳහා ප්‍රවෘත්ති නිලධාරි, එම්.එන්.ප්‍රනාන්දු මෙය සහභාගි වී ඇත.

XV. 2018.08.17 දින සිට 2018.08.23 දින දක්වා ඉන්දියානු වෘත්තීය පත්‍ර කලාවේදීන්ගේ සංගමයේ මහා සමුළුව සඳහා ප්‍රවෘත්ති නිලධාරි, එම්.ඒ.ජයසිංහ මහතා සහභාගි වී ඇත.

XVI. 2018.08.28 දින සිට 2018.09.02 දින දක්වා ජනාධිපති නේපාල සංචාරයේ මාධ්‍ය ආවරණ කටයුතු වෙනුවෙන් තාක්ෂණ නිලධාරි, එල්.ඒ.එල්.සිගේරා මහතා සහභාගි වී ඇත.

XVII. 2018.08.28 දින සිට 2018.09.02 දින දක්වා ජනාධිපති නේපාල සංචාරයේ මාධ්‍ය ආවරණ කටයුතු වෙනුවෙන් තාක්ෂණ නිලධාරි, එල්.ඒ.එල්.සිගේරා මහතා සහභාගි වී ඇත.

XVIII. 2018.11.14 දින සිට 2018.11.23 දින දක්වා ඉන්දියාවේ පැවැත්වූ “Film Preservation & Restoration Workshop” පුහුණු වැඩමුළුව සඳහා තාක්ෂණ නිලධාරි, ලාල් විජේතුංග මහතා සහභාගි වී ඇත.

XIX. 2018.11.14 දින සිට 2018.11.23 දින දක්වා ඉන්දියාවේ පැවැත්වූ “Film Preservation & Restoration Workshop” පුහුණු වැඩමුළුව සඳහා නෙගටිව් භාරකරු, එම්.එන්.සී.පීරිස් මහතා සහභාගි වී ඇත.

# 02. මූල්‍ය අංශය

## 02.1 හැඳින්වීම :

රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ ගිණුම් අංශය ප්‍රධාන ගණකාධිකාරීවරයෙකු යටතේ ක්‍රියාත්මක වන අතර, එම අංශයට අදාළව ගණකාධිකාරීවරයෙකු හා විෂය නිලධාරීන් 16 දෙනෙකු කටයුතු කරයි. දෙපාර්තමේන්තුවට අදාළව සියලුම ගෙවීම් කටයුතු, වැටුප් ගෙවීම, ආදායම් හා වත්කම්වලට අදාළව ලේඛන පවත්වාගෙන යාම හා දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කටයුතු සිදු කිරීම ගිණුම් අංශයේ ප්‍රධාන කාර්යභාරය වේ. 2018 වර්ෂයට අදාළව දෙපාර්තමේන්තුවේ මූල්‍ය ක්‍රියාකාරීත්වය පහත දක්වා ඇත.

## 02.2 2018 වර්ෂය තුළ ප්‍රාග්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම

2018 වර්ෂයේ පහත සඳහන් ප්‍රාග්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ලදි.

### 1. දිස්ත්‍රික් මාධ්‍ය ඒකකවල පහසුකම් වැඩි දියුණු කිරීම

එක්, එක් දිස්ත්‍රික් ලේකම් යටතේ දෙපාර්තමේන්තුවට අනුබද්ධ දිස්ත්‍රික් කාර්යාල 20ක් ස්ථාපිත කොට ඇත. නමුත් වසර ගණනාවක් තිස්සේ එම කාර්යාලවල කාර්යක්ෂමතාව වර්ධනය කර ගැනීම සඳහා අවශ්‍ය නවීන උපකරණ ලබා දීමට නොහැකි වී තිබුණි. 2018 වර්ෂය තුළදී රු.මිලියන 11.8ක් වටිනා පහත සඳහන් උපකරණ ලබාදීමට කටයුතු කරන ලදි.

| උපකරණය | ප්‍රමාණය | වටිනාකම (රු.) |
|---|---|---|
| පරිගණක | 9 | 1,647,000.00 |
| ලැප්ටොප් | 12 | 2,148,000.00 |
| ෆැක්ස් | 7 | 181,125.00 |
| වීඩියෝ කැමරා | 16 | 5,100,480.00 |
| ඩිජිටල් කැමරා | 11 | 673,200.00 |
| ෆොටෝ කොපි යන්ත්‍ර | 12 | 1,373,100.00 |
| අනෙකුත් කාර්යාල උපකරණ | | 695,951.00 |
| එකතුව | | 11,818,856.00 |

### 2. රජයේ චිත්‍රපට අංශයේ පහසුකම් වැඩිදියුණු කිරීම

මේ යටතේ කැමරා, සංස්කරණ, නිෂ්පාදන හා ශබ්ද යන අංශයන් සඳහා උපකරණ මිලදී ගැනීමට කටයුතු කරන ලදි. ඊට අදාළ තොරතුරු පහත දැක්වේ.

| විස්තරය | ඇණවුම් වටිනාකම රු. | 2018.12.31 දිනට සපයා ඇති භාණ්ඩවල වටිනාකම රු. | 2018.12.31 දිනට වියදම රු. |
|---|---|---|---|
| 1. ශබ්දාගාරය සඳහා ආලෝක උපකරණ මිලදී ගැනීම | 4,013,068.00 | 4,013,068.00 | 4,013,068.00 |
| 2. තාක්ෂණික උපකරණ මිලදී ගැනීම | 11,105,320.00 | 6,477,405.00 | - |
| 3. සංරක්ෂණ පද්ධතිය ස්ථාපිත කිරීම | 11,837,600.00 | 4,806,200.00 | 4,413,014.00 |

මෙම ඇණවුම්වලට අදාළ ඉතිරි භාණ්ඩ 2019 පෙබරවාරි මස තුළදී සපයන ලදී.

### 3. දෙපාර්තමේන්තුවේ විවිධ අංශ සඳහා ප්‍රාග්ධන උපකරණ මිලදී ගැනීම

මේ යටතේ විවිධ අංශ සඳහා රු.6,388,642.00ක් වැය කොට ලැප්ටොප් පරිගණක, පරිගණක, වායුසමීකරණ, මුද්‍රණ යන්ත්‍ර හා අනෙකුත් කාර්යාල උපකරණ මිලදී ගෙන ඇත.

## 02.3 විගණන විමසුම්

දෙපාර්තමේන්තුව වෙත 2018 වර්ෂය තුළදී විගණකාධිපති දෙපාර්තමේන්තුව විසින් විගනන විමසුම් 8ක් ඉදිරිපත් කර ඇති අතර, 2017 වර්ෂය හා ඊට පෙර ඉදිරිපත් කළ විගණන විමසුම් 02ක් සඳහා පිළිතුරු සපයා නොතිබුණි. 2018 වර්ෂය තුලදී විගණන විමසුම් 8ක් සඳහා පිළිතුරු සපයා ඇත. දෙපාර්තමේන්තුව සම්බන්ධයෙන් 2018 වර්ෂයේදී අභ්‍යන්තර විගණන අංශය විසින් විගණන විමසුම් 3ක් ඉදිරිපත් වී ඇති අතර ඉන් 2ක් සඳහා වර්ෂය තුළදී පිළිතුරු සපයා ඇත.

## 2018 වර්ෂයට අදාළ දෙපාර්තමේන්තු මූල්‍ය ක්‍රියාකාරීත්වය

| 2018 වියදම | | | | | | | 210-01-01 |
|---|---|---|---|---|---|---|---|
| අයිතමය | විස්තරය | ඇස්තමේන්තුව | මු.රෙ.66/අ.ප්‍ර | ශුද්ධ වෙන් කිරීම | මුළු වියදම | ඉතිරිය | % |
| 1001 | වැටුප් හා වේතන | 22,000,000.00 | - | 22,000,000.00 | 21,935,020.48 | 64,979.52 | 100 |
| 1002 | අතිකාල හා නිවාඩු දින වැටුප් | 3,500,000.00 | -200,000.00 | 3,300,000.00 | 3,261,808.83 | 38,191.17 | 99 |
| 1003 | වෙනත් දීමනා | 10,000,000.00 | - | 10,000,000.00 | 9,965,542.36 | 34,457.64 | 100 |
| **එකතුව** | | **35,500,000.00** | **-** | **35,300,000.00** | **35,162,371.67** | **137,628.33** | **100** |
| 1101 | ගමන් වියදම් (දේශීය) | 500,000.00 | -50,000.00 | 450,000.00 | 449,949.78 | 50.22 | 100 |
| 1102 | ගමන් වියදම් (විදේශ) | 1,000,000.00 | - | 1,000,000.00 | 965,399.20 | 34,600.80 | 97 |
| 1201 | ලිපි ද්‍රව්‍ය හා කාර්යාල අවශ්‍යතා | 2,300,000.00 | 1,260,000.00 | 3,560,000.00 | 3,548,065.48 | 11,934.52 | 100 |
| 1202 | ඉන්ධන | 2,600,000.00 | 280,000.00 | 2,880,000.00 | 2,876,740.50 | 3,259.50 | 100 |
| 1203 | ආහාරපාන සහ නිල ඇඳුම් | 350,000.00 | - | 350,000.00 | 337,301.50 | 12,698.50 | 96 |
| 1204 | වෛද්‍ය සැපයීම් | 30,000.00 | -20,000.00 | 10,000.00 | 9,518.73 | 481.27 | 95 |
| 1205 | වෙනත් සැපයීම් | 100,000.00 | - | 100,000.00 | 96,305.64 | 3,694.36 | 96 |
| 1301 | වාහන | 1,800,000.00 | - | 1,800,000.00 | 1,794,982.01 | 5,017.99 | 100 |
| 1302 | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 1,000,000.00 | -240,000.00 | 760,000.00 | 754,347.86 | 5,652.14 | 99 |
| 1303 | ගොඩනැගිලි හා ඉදිකිරීම් | 3,500,000.00 | -3,100,000.00 | 400,000.00 | 399,188.05 | 811.95 | 100 |
| 1401 | ප්‍රවාහන | 5,080,000.00 | -3,950,000.00 | 1,130,000.00 | 1,100,395.00 | 29,605.00 | 97 |
| 1402 | තැපැල් හා සන්නිවේදන | 2,500,000.00 | 1,400,000.00 | 3,900,000.00 | 3,897,162.18 | 2,837.82 | 100 |
| 1403 | විදුලිය හා ජලය | 2,200,000.00 | -500,000.00 | 1,700,000.00 | 1,697,667.34 | 2,332.66 | 100 |
| 1404 | බදු කුලී සහ පළාත් පාලන ආයතන බදු | 450,000.00 | - | 450,000.00 | 436,320.00 | 13,680.00 | 97 |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 1409 | වෙනත් | - | - | - | - | - | - |
| | පවිත්‍රතා සේවා | 8,600,000.00 | 3,850,000.00 | 12,450,000.00 | 12,433,873.10 | 16,126.90 | 100 |
| 1506 | රාජ්‍ය සේවක වැටුප් ණය පොළී | 350,000.00 | 50,000.00 | 400,000.00 | 393,450.41 | 6,549.59 | 98 |
| 1701 | පාඩු හා අත්හැරීම් | 20,000.00 | 46,232.00 | 66,232.00 | 66,232.00 | 0.00 | 100 |
| **එකතුව** | | **67,880,000.00** | | **66,706,232.00** | **66,419,270.45** | **286,961.55** | **100** |
| 2001 | ගොඩනැගිලි හා ඉදිකිරීම් | - | - | - | - | - | - |
| 2002 | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 300,000.00 | - | 300,000.00 | 213,292.99 | 86,707.01 | 71 |
| 2003 | වාහන | 1,000,000.00 | 2,100,000.00 | 3,100,000.00 | 2,947,634.00 | 152,366.00 | 95 |
| 2102 | ගෘහ භාණ්ඩ හා කාර්යාලීය අවශ්‍යතා | 400,000.00 | 746,600.00 | 1,146,600.00 | 1,146,542.00 | 58.00 | 100 |
| 2103 | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ (මිලදී ගැනීම) | 500,000.00 | -200,300.00 | 299,700.00 | 299,690.00 | 10.00 | 100 |
| 2401 | පුහුණු කිරීම සහ සංවර්ධනය | 400,000.00 | 1,300,000.00 | 1,700,000.00 | 1,699,971.59 | 28.41 | 100 |
| 2103 | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ (මිලදී ගැනීම) | 14,500,000.00 | - | 14,500,000.00 | - | 14,500,000.00 | 0 |
| **එකතුව** | | **17,100,000.00** | **-** | **21,046,300.00** | **6,307,130.58** | **14,739,169.42** | **30** |
| **මුළු එකතුව** | | **84,980,000.00** | **-** | **87,752,532.00** | **72,726,401.03** | **15,026,130.97** | **83** |

| 2018 වියදම | | | | | | | 210-01-02 |
|---|---|---|---|---|---|---|---|
| අයිතමය | විස්තරය | ඇස්තමේන්තුව | මු.රෙ.66/අ.ප්‍ර | ශුද්ධ වෙන් කිරීම් | මුළු වියදම | ඉතිරිය | % |
| 1001 | වැටුප් හා වේතන | 40,000,000.00 | - | 40,000,000.00 | 38,939,767.65 | 1,060,232.35 | 97 |
| 1002 | අතිකාල හා නිවාඩු දින වැටුප් | 4,000,000.00 | 1,500,000.00 | 5,500,000.00 | 5,432,547.54 | 67,452.46 | 99 |
| 1003 | වෙනත් දීමනා | 22,500,000.00 | -4,026,232.00 | 18,473,768.00 | 17,726,737.48 | 747,030.52 | 96 |
| **එකතුව** | | **66,500,000.00** | **-** | **63,973,768.00** | **62,099,052.67** | **1,874,715.33** | **97** |
| 1101 | ගමන් වියදම් (දේශීය) | 1,000,000.00 | 50,000.00 | 1,050,000.00 | 952,063.75 | 97,936.25 | 91 |
| 1102 | ගමන් වියදම් (විදේශ) | 2,000,000.00 | 10,000.00 | 2,010,000.00 | 2,010,000.00 | 0.00 | 100 |
| 1201 | ලිපි ද්‍රව්‍ය හා කාර්යාල අවශ්‍යතා | 3,000,000.00 | 670,000.00 | 3,670,000.00 | 3,664,742.89 | 5,257.11 | 100 |
| 1202 | ඉන්ධන | 3,800,000.00 | - | 3,800,000.00 | 3,799,780.00 | 220.00 | 100 |
| 1203 | ආහාරපාන සහ නිල ඇඳුම් | - | - | - | - | - | - |
| 1204 | වෛද්‍ය සැපයීම් | - | - | - | - | - | - |
| 1205 | වෙනත් සැපයීම් | 1,000,000.00 | -160,000.00 | 840,000.00 | 801,529.25 | 38,470.75 | 95 |
| 1301 | වාහන | 2,700,000.00 | 505,000.00 | 3,205,000.00 | 3,103,011.29 | 101,988.71 | 97 |
| 1302 | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 2,600,000.00 | -1,000,000.00 | 1,600,000.00 | 1,597,802.26 | 2,197.74 | 100 |
| 1303 | ගොඩනැගිලි හා ඉදිකිරීම් | 200,000.00 | -70,000.00 | 130,000.00 | 127,464.56 | 2,535.44 | 98 |
| 1401 | ප්‍රවාහන | 1,500,000.00 | -500,000.00 | 1,000,000.00 | 951,155.00 | 48,845.00 | 95 |
| 1402 | තැපැල් හා සන්නිවේදන | 4,000,000.00 | 1,280,000.00 | 5,280,000.00 | 5,225,589.62 | 54,410.38 | 99 |
| 1403 | විදුලිය හා ජලය | 4,500,000.00 | -1,600,000.00 | 2,900,000.00 | 2,883,149.45 | 16,850.55 | 99 |
| 1404 | බදු කුලී සහ පළාත් පාලන ආයතන බදු | - | - | - | - | - | - |
| 1409 | වෙනත් | - | - | - | - | - | - |
| | ප්‍රවාරන | 400,000,000.00 | -1,713,900.00 | 398,286,100.00 | 315,723,778.05 | 82,562,321.95 | 79 |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 1506 | රාජ්‍ය සේවක වැටුප් ණය පොළී | 1,200,000.00 | - | 1,200,000.00 | 1,154,354.87 | 45,645.13 | 96 |
| **එකතුව** | | **494,000,000.00** | **-** | **488,944,868.00** | **404,093,473.66** | **84,851,394.34** | **83** |
| 2001 | ගොඩනැගිලි හා ඉදිකිරීම් | 15,000,000.00 | - | 15,000,000.00 | 5,660,409.46 | 9,339,590.54 | 38 |
| 2002 | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 500,000.00 | - | 500,000.00 | 331,755.04 | 168,244.96 | 66 |
| 2003 | වාහන | 1,500,000.00 | - | 1,500,000.00 | 1,500,000.00 | 0.00 | 100 |
| 2102 | ගෘහ භාණ්ඩ හා කාර්යාලීය අවශ්‍යතා | 4,500,000.00 | 4,917,600.00 | 9,417,600.00 | 9,398,482.13 | 19,117.87 | 100 |
| 2103 | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ (මිලදී ගැනීම) | 12,500,000.00 | -5,125,000.00 | 7,375,000.00 | 7,362,785.05 | 12,214.95 | 100 |
| 2401 | පුහුණු කිරීම සහ සංවර්ධනය | 3,000,000.00 | 2,900,000.00 | 5,900,000.00 | 5,899,138.34 | 861.66 | 100 |
| 2103 | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ (මිලදී ගැනීම) 1 | 25,000,000.00 | - | 25,000,000.00 | - | 25,000,000.00 | 0 |
| 2103 | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ (මිලදී ගැනීම) 2 | 12,000,000.00 | - | 12,000,000.00 | - | 12,000,000.00 | 0 |
| **එකතුව** | | **74,000,000.00** | **-** | **76,692,600.00** | **30,152,570.02** | **46,540,029.98** | **39** |
| **මුළු එකතුව** | | **568,000,000.00** | **-** | **565,637,468.00** | **434,246,043.68** | **131,391,424.32** | **77** |

| **2018 වියදම** | | | | | | | **210-01-03** |
|---|---|---|---|---|---|---|---|
| අයිතමය | විස්තරය | ඇස්තමේන්තුව | මු.රෙ.66/අ.පු | ශුද්ධ වෙන් කිරීම් | මුළු වියදම | ඉතිරිය | % |
| 1001 | වැටුප් හා වේතන | 19,000,000.00 | -1,000,000.00 | 18,000,000.00 | 16,813,637.12 | 1,186,362.88 | 93 |
| 1002 | අතිකාල හා නිවාඩු දින වැටුප් | 3,000,000.00 | 1,000,000.00 | 4,000,000.00 | 3,829,814.36 | 170,185.64 | 96 |
| 1003 | වෙනත් දීමනා | 7,000,000.00 | -1000,000.00 | 6,000,000.00 | 5,724,643.23 | 275,356.77 | 95 |
| **එකතුව** | | **29,000,000.00** | **-** | **28,000,000.00** | **26,368,094.71** | **1,631,905.29** | **94** |
| 1101 | ගමන් වියදම් (දේශීය) | 700,000.00 | - | 700,000.00 | 675,937.38 | 24,062.62 | 97 |
| 1102 | ගමන් වියදම් (විදේශ) | 600,000.00 | - | 600,000.00 | 599,812.48 | 187.52 | 100 |
| 1201 | ලිපි ද්‍රව්‍ය හා කාර්යාල අවශ්‍යතා | 1,500,000.00 | 780,000.00 | 2,280,000.00 | 2,278,020.62 | 1,979.38 | 100 |
| 1202 | ඉන්ධන | 2,700,000.00 | -300,000.00 | 2,400,000.00 | 2,399,933.00 | 67.00 | 100 |
| 1203 | ආහාරපාන සහ නිල ඇඳුම් | 50,000.00 | - | 50,000.00 | 49,680.00 | 320.00 | 99 |
| 1204 | වෛද්‍ය සැපයීම් | - | - | - | - | - | - |
| 1205 | වෙනත් සැපයීම් | 200,000.00 | -200,000.00 | 0.00 | 0.00 | 0.00 | 0 |
| 1301 | වාහන | 1,500,000.00 | | 1,500,000.00 | 1,495,487.30 | 4,512.70 | 100 |
| 1302 | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 300,000.00 | -90,000.00 | 210,000.00 | 203,421.75 | 6,578.25 | 97 |
| 1303 | ගොඩනැගිලි හා ඉදිකිරීම් | 50,000.00 | -50,000.00 | 0.00 | 0.00 | 0.00 | 0 |
| 1401 | ප්‍රවාහන | 1,000,000.00 | -960,000.00 | 40,000.00 | 33,742.50 | 6,257.50 | 84 |
| 1402 | තැපැල් හා සන්නිවේදන | 2,000,000.00 | - | 2,000,000.00 | 1,998,694.65 | 1,305.35 | 100 |
| 1403 | විදුලිය හා ජලය | 3,000,000.00 | 800,000.00 | 3,800,000.00 | 3,679,056.19 | 120,943.81 | 97 |
| 1404 | බදු කුලී සහ පළාත් පාලන ආයතන බදු | - | - | - | - | - | - |
| 1409 | වෙනත් | - | - | - | - | - | - |
| | චිත්‍රපට නිෂ්පාදන | 400,000,000.00 | 660,000.00 | 4,660,000.00 | 4,638,868.88 | 21,131.12 | 100 |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 1506 | රාජ්‍ය සේවක වැටුප් ණය පොළී | 450,000.00 | -50,000.00 | 400,000.00 | 387,661.80 | 12,338.20 | 97 |
| **එකතුව** | | **47,050,000.00** | | **46,640,000.00** | **44,808,411.26** | **1,831,588.74** | **96** |
| 2001 | ගොඩනැගිලි හා ඉදිකිරීම් | - | - | - | - | - | - |
| 2002 | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | - | - | - | - | - | - |
| 2003 | වාහන | - | - | - | - | - | - |
| 2102 | ගෘහ භාණ්ඩ හා කාර්යාලීය අවශ්‍යතා | - | - | - | - | - | - |
| 2103 | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ (මිලදී ගැනීම) | 48,000,000.00 | - | 48,000,000.00 | 8,426,081.21 | 39,573,918.79 | 18 |
| 2401 | පුහුණු කිරීම සහ සංවර්ධනය | 400,000.00 | - | 400,000.00 | 399,800.00 | 200.00 | 100 |
| 2103 | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ (මිලදී ගැනීම) 1 | - | - | - | - | - | - |
| 2103 | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ (මිලදී ගැනීම) 2 | - | - | - | - | - | - |
| **එකතුව** | | **48,400,000.00** | **-** | **48,400,000.00** | **8,825,881.21** | **39,574,118.79** | **18** |
| **මුළු එකතුව** | | **95,450,000.00** | **-** | **95,040,000.00** | **53,634,292.47** | **41,405,707.53** | **56** |

| | | | | වියදම් සාරාංශය - 2018 | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| අයිතමය | විස්තරය | ඇස්තමේන්තුව | මු.රෙ 66 / අ.ප්‍ර | ශුද්ධ වෙන් කිරීම | 1 ව්‍යාපෘතිය | 2 ව්‍යාපෘතිය | 3 ව්‍යාපෘතිය | වියදමේ | ඉතිරිය | % |
| 1001 | වැටුප් හා වේතන | 81,000,000.00 | -1,000,000.00 | 80,000,000.00 | 21,935,020.48 | 38,939,767.65 | 16,813,637.12 | 77,688,425.25 | 2,311,574.75 | 97 |
| 1102 | අතිකාල හා නිවාඩු දින වැටුප් | 10,500,000.00 | 2,300,000.00 | 12,800,000.00 | 3,261,808.83 | 5,432,547.54 | 3,829,814.36 | 12,524,170.73 | 275,829.27 | 98 |
| 1003 | වෙනත් දීමනා | 39,500,000.00 | -5,,026,232.00 | 34,473,768.00 | 9,965,542.36 | 17,726,737.48 | 5,724,643.23 | 33,416,923.07 | 1,056,844.93 | 97 |
| | එකතුව | 131,000,000.00 | - | 127,273,768.00 | 35,162,371.67 | 62,099,052.67 | 26,368,094.71 | 123,629,519.05 | 3,644,248.95 | 97 |
| 1101 | ගමන් වියදම් (දේශීය) | 2,200,000.00 | - | 2,200,000.00 | 449,949.78 | 952,063.75 | 675,937.38 | 2,077,950.91 | 122,049.09 | 94 |
| 1102 | ගමන් වියදම් (විදේශ) | 3,600,000.00 | 10,000.00 | 3,610,000.00 | 965,399.20 | 2,010,000.00 | 599,812.48 | 3,575,211.68 | 34,788.32 | 99 |
| 1201 | ලිපි ද්‍රව්‍ය හා කාර්යාල අවශ්‍යතා | 6,800,000.00 | 2,710,000.00 | 9,510,000.00 | 3,548,065.48 | 3,664,742.89 | 2,278,020.62 | 9,490,828.99 | 19,171.01 | 100 |
| 1202 | ඉන්ධන | 9,100,000.00 | -20,000.00 | 9,080,000.00 | 2,876,740.50 | 3,799,780.00 | 2,399,933.00 | 9,076,453.50 | 3,546.50 | 100 |
| 1203 | ආහාර පාන සහ නිල ඇඳුම් | 400,000.00 | - | 400,000.00 | 337,301.50 | 0.00 | 49,680.00 | 386,981.50 | 13,018.50 | 97 |
| 1204 | වෛද්‍ය සැපයීම් | 30,000.00 | -20,000.00 | 10,000.00 | 9,518.73 | 0.00 | 0.00 | 9,518.73 | 481.27 | 95 |
| 1205 | වෙනත් සැපයීම් | 1,300,000.00 | -360,000.00 | 940,000.00 | 96,305.64 | 801,529.25 | 0.00 | 897,834.89 | 42,165.11 | 96 |
| 1301 | වාහන | 6,000,000.00 | 505,000.00 | 6,505,000.00 | 1,794,982.01 | 3,103,011.29 | 1,495,487.30 | 6,393,480.60 | 111,519.40 | 98 |
| 1302 | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 3,900,000.00 | -1,330,000.00 | 2,570,000.00 | 754,347.86 | 1,597,802.26 | 203,421.75 | 2,555,571.87 | 14,428.13 | 99 |
| 1303 | ගොඩනැලගිලි හා ඉදිකිරීම් | 3,750,000.00 | -3,220,000.00 | 530,000.00 | 399,188.05 | 127,464.56 | 0.00 | 526,652.61 | 3,347.39 | 99 |
| 1401 | ප්‍රවාහන | 7,580,000.00 | -5,410,000.00 | 2,170,000.00 | 1,100,395.00 | 951,155.00 | 33,742.50 | 2,085,292.50 | 84,707.50 | 96 |
| 1402 | තැපැලි හා සන්නිවේදන | 8,500,000.00 | 2,680,000.00 | 11,180,000.00 | 3,897,162.18 | 5,225,589.62 | 1,998,694.65 | 11,121,446.45 | 58,553.55 | 99 |
| 1403 | විදුලිය හා ජලය | 9,700,000.00 | -1,300,000.00 | 8,400,000.00 | 1,697,667.34 | 2,883,149.45 | 3,679,056.19 | 8,259,872.98 | 140,127.02 | 98 |
| 1404 | බදු කුලී සහ පළාත් පාලන ආයතන බදු | 450,000.00 | - | 450,000.00 | 436,320.00 | 0.00 | .0.00 | 436,320.00 | 13,680.00 | 97 |
| 1409 | වෙනත් | - | - | - | - | - | - | - | - | - |
| | පවිත්‍රතා සේවා | 8,600,000.00 | 2,796,100.00 | 11,396,100.00 | 12,433,873.10 | | | 12,433,873.10 | -1,037,773.10 | 109 |
| | ප්‍රචාරන | 400,000,000.00 | - | 400,000,000.00 | - | 315,723,778.05 | - | 315,723,778.05 | 84,276,221.95 | 79 |
| | මුද්‍රණ | - | - | - | - | - | - | - | - | - |
| | පර්යේෂණ | - | - | - | - | - | - | - | - | - |
| | චිත්‍රපට නිෂ්පාදන | 4,000,000.00 | - | 4,000,000.00 | | | 4,638,868.88 | 4,638,868.88 | -638,868.88 | 116 |
| 1503 | රාජ්‍ය සේවක වැටුප් ණය පොළී | 2,000,000.00 | - | 2,000,000.00 | 393,450.41 | 1,154,354.87 | 387,661.80 | 1,935,467.08 | 64,532.92 | 97 |
| 1702 | පාඩු හා අත්හැරීම් | 20,000.00 | 46,232.00 | 66,232.00 | 66,232.00 | 0.00 | 0.00 | 66,232.00 | 0.00 | 100 |
| | පුනරාවර්තන | 608,930,000.00 | - | 602,291,100.00 | 66,419,270.45 | 404,093,473.66 | 44,808,411.26 | 515,321,155.37 | 86,969,944.63 | 86 |
| 2001 | ගොඩනැගිලි හා ඉදිකිරීම් | 15,000,000.00 | - | 15,000,000.00 | 0.00 | 5,660,409.46 | 0.00 | 5,660,409.46 | 9,339,590.54 | 38 |
| 2002 | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 800,000.00 | - | 800,000.00 | 213,292.99 | 331,755.04 | 0.00 | 545,048.03 | 254,951.97 | 68 |
| 2003 | වෙනත් | 2,500,000.00 | 2,100,000.00 | 4,600,000.00 | 2,947,634.00 | 1,500,000.00 | 0.00 | 4,447,634.00 | 152,366.00 | 97 |
| 2102 | ගෘහ භාණ්ඩ හා කාර්යාලීය අවශ්‍යතා | 4,900,000.00 | 5,664,200.00 | 10,564,200.00 | 1,146,542.00 | 9,398,482.13 | 0.00 | 10,545,024.13 | 19,175.87 | 100 |
| 2103 | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ (මිලදී ගැනීම) | 112,500,000.00 | -5,325,300.00 | 107,174,700.00 | 299,690.00 | 7,362,785.05 | 8,426,081.21 | 16,088,556.26 | 91,086,143.74 | 15 |
| 2401 | පුහුණු කිරීම සහ සංවර්ධනය | 3,800,000.00 | 4,200,000.00 | 8,000,000.00 | 1,699,971.59 | 5,899,138.34 | 399,800.00 | 7,998,909.93 | 1,090.07 | 100 |
| | ප්‍රාග්ධන | 139,500,000.00 | - | 146,138,900.00 | 6,307,130.58 | 30,152,570.02 | 8,825,881.21 | 45,285,581.81 | 100,853,318.1 | 31 |
| මුළු එකතුව | | 748,430,000.00 | - | 748,430,000.00 | 72,726,401.03 | 434,246,043.68 | 53,634,292.47 | 560,606,737.18 | 187,823,262.8 | 75 |

## 03. ප්‍රචාරක අංශය

රජයේ සංවර්ධන පුවත් ජනතාව වෙත ගෙන යාමේ දෙපාර්තමේන්තුවේ මූලික අභිමතාර්ථය යථාර්තයක් බවට පත් කිරීමේ ප්‍රමුඛතම කාර්යභාරයක් ඉටු කරන අංශයක් ලෙස ප්‍රචාරක අංශය සැලකිය හැක. මෙහිදී වෙනත් ආයතන ලෙස ගැනෙන අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, සංස්ථා, මණ්ඩල වැනි ආයතන මගින් ජනතාවට සැලසෙන සේවාවන් වෙනුවෙන් අවශ්‍ය ප්‍රචාරණ කාර්යය සිදු කිරීම ද මූලික කාර්යයක් ලෙස සලකා කටයුතු කෙරේ.

එමෙන්ම රජය වෙනුවෙන් සංවිධානය කෙරෙන විශේෂ උත්සව සංවිධානය මෙන්ම එකී අවස්ථාවන්ට අදාල මාධ්‍ය ආවරණය ලබා දීම ද මේ යටතේ සිදු වේ. තවද රජයේ නිල පුවත් ජනතාව වෙත සමීප කිරීමේ කාර්ය භාරයද දෙපාර්තමේන්තුව වෙනුවෙන් මෙම අංශය විසින් සිදු කරනු ලබයි. විශේෂයෙන්ම රජය වෙනුවෙන් මාධ්‍ය නිවේදන නිකුත් කිරීම, රජයේ කැබිනට් තීරණ මාධ්‍ය ආයතන වෙත නිකුත් කිරීම, විවිධ අවස්ථාවන් පිළිබඳ මාධ්‍ය දැනුවත් කරනු වස් මාධ්‍ය සාකච්ඡා සංවිධානය කිරීම, සංවර්ධන ව්‍යාපෘතිවල මාධ්‍ය ආවරණය වෙනුවෙන් මාධ්‍යවේදීන් කැඳවා යාමේ වැඩසටහන් සංවිධානය මෙන්ම විදෙස් රාජතාන්ත්‍රික දූත පිරිස් ලංකාවට පැමිණෙන අවස්ථාවන් හා විවිධ ජාතික වැදගත්කමකින් යුතු අවස්ථා ආවරණයට මාධ්‍යවේදීන්ට අවස්ථාව සැලසීමත් මේ අංශය යටතේ සිදු කෙරේ.

ඒ අනුව 2018 වර්ෂයේ ප්‍රචාරක අංශය යටතේ පහත සඳහන් කාර්යයන් ඉටු කර ඇත.

| වැඩසටහන / ව්‍යාපෘතිය | ක්‍රියාකාරකම් | සිදු කරන ලද කාර්යභාරය | පැවැත්වූ ස්ථාන | මහජනතාවට වැදගත් වූ ආකාරය |
|---|---|---|---|---|
| **01. තොරතුරු දැන ගැනීමේ අයිතිය ප්‍රවර්ධනය කිරීම සඳහා රජයේ සංවර්ධන, ප්‍රචාරණ වැඩපිළිවෙළ පිළිබඳ තොරතුරු ජනතාව වෙත සන්නිවේදනය කිරීම** | | | | |
| ප්‍රවෘත්ති සාකච්ඡා පැවැත්වීම | 1. කැබිනට් තීරණ දැනුම් දීමේ ප්‍රවෘත්ති සාකච්ඡා සංවිධානය කිරීම | රජයේ ප්‍රතිපත්ති, තීරණ පිළිබඳ ජනතාව දැනුවත් කිරීම | රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව සහ අනෙකුත් රාජ්‍ය ආයතන තුළ | රජය විසින් ගනු ලබන තීරණ සම්බන්ධව දැනුවත් වීම නිසා රජයේ කටයුතු පිළිබඳව මහජන අවබෝධය පුළුල් වීම |
| | 2. රජයේ විශේෂ ව්‍යාපෘති හා සංවර්ධන කටයුතු පිළිබඳ ප්‍රවෘත්ති | රජයේ සංවර්ධන කටයුතු පිළිබඳව මහජනතාව දැනුවත් කිරීම | රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව සහ අනෙකුත් රාජ්‍ය ආයතන තුළ | රජයේ සංවර්ධන කටයුතු පිළිබඳව මහජනතාව පුළුල් |

| | | | | |
|---|---|---|---|---|
| | සාකච්ඡා පැවැත්වීම | | | අවබෝධයක් ලබා ගැනීම |
| | 3. වෙනත් රාජ්‍ය ආයතනයන්හි ප්‍රවෘත්ති සාකච්ඡා සම්බන්ධීකරණය කිරීම | රජයේ සංවර්ධන කටයුතු පිළිබඳව මහජනතාව දැනුවත් කිරීම | රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව සහ අනෙකුත් රාජ්‍ය ආයතන තුළ | එම ආයතන විසින් සිදු කරනු ලබන විවිධ සංවර්ධන කාර්යයන් පිළිබඳව මහජනතාව දැනුවත් වීම |
| | 4. රජයේ නිල මාධ්‍ය නිවේදන නිකුත් කිරීම | හදිසි හා විශේෂ අවස්ථා පිළිබඳ ජනතාව දැනුවත් කිරීම | - | රජය විසින් ගනු ලබන ඉතාම වැදගත් තීරණ පිළිබඳව මහජන අවධානය යොමු කිරීම |
| | 5. තොරතුරු පත්‍රිකා සකස් කිරීම | සමාජය විසින් අවධානයට යොමු කළ යුතු ක්ෂේත්‍ර පිළිබඳ මහජනතාවගේ දැනුම හා අවබෝධය ලබා දීම | - | රජයේ සංවර්ධන කටයුතු හා විවිධ කටයුතු පිළිබඳව විස්තරාත්මක දැනුවත් වීම |
| මාධ්‍ය ආවරණ හා මාධ්‍ය සංචාර සංවිධානය කිරීම | 1. විදේශ රාජ්‍ය තාන්ත්‍රිකයන්ගේ පැමිණීම් මාධ්‍ය ආවරණ සංවිධානය කිරීම | ලංකාවට පැමිණෙන විදෙස් රාජ්‍ය තාන්ත්‍රිකයන් පිළිබඳ ජනතාවගේ අවධානය යොමු කිරීම | ජනාධිපති කාර්යාලය, අගමැති කාර්යාලය, ගුවන්තොටුපල යනාදී ආයතන සහ ස්ථානයන් තුළ | ඒ, ඒ විදෙස් රාජ්‍යයන් සමඟ වන විදෙස් ප්‍රතිපත්තිය පිළිබඳ යම්කිසි අවබෝධයක් මෙමගින් මහජනතාවට ලබා ගැනීමට හැකි වීම |
| | 2. සංවර්ධන වැඩසටහන් පිළිබඳ මාධ්‍ය සංචාර සංවිධානය කිරීම | ප්‍රාදේශීය වශයෙන් සිදුවන සංවර්ධනය පිළිබඳ ජනතා අවබෝධය පුළුල් කිරීම | හම්බන්තොට, කුරුණෑගල, මාතලේ, මහනුවර, මොරගහකන්ද, මිරිජ්ජවිල, වීරවිල යනාදී ප්‍රදේශයන් තුළ | රටේ විවිධ ප්‍රදේශවල සිදුවන සංවර්ධන කාර්යයන් පිළිබඳව ජනතාව දැනුවත් කිරීම නිසා ඒ සම්බන්ධව මනා අවබෝධයක් ඇති වීම |
| | 3. මාධ්‍ය ආවරණ සම්බන්ධීකරණය කිරීම | රාජ්‍ය ආයතනවල විවිධ විෂයයන් පිළිබඳ ජනතා | රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව සහ අනෙකුත් රාජ්‍ය ආයතන තුළ | ඒ, ඒ ආයතනවල ගනු ලබන ප්‍රතිපත්ති හා තීරණ ක්‍රියාත්මක කිරීමේ සටහන් පිළිබඳව |

| | | | | |
|---|---|---|---|---|
| | | දැනුවත් බව වර්ධනය කිරීම | | මෙමගින් මහජන අවබෝධය පුළුල් කිරීම |
| **02. ප්‍රමිතිගත මාධ්‍ය සම්ප්‍රදායක් ඇති කිරීම** | | | | |
| රාජ්‍ය නිලධාරීන් හා රජයේ සහ පෞද්ගලික මාධ්‍ය අතර පවතින සම්බන්ධතාවය වැඩිදියුණු කිරීම සඳහා ක්‍රමවේදයක් සකස් කිරීම | 1. දැනුවත් කිරීමේ වැඩසටහන් සංවිධානය කිරීම | විවිධ ක්ෂේත්‍ර පිළිබඳව මාධ්‍යවේදීන් දැනුවත් කිරීම | රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව සහ අනෙකුත් රාජ්‍ය / පෞද්ගලික ආයතන තුළ | විවිධ ක්ෂේත්‍ර පිළිබඳව මාධ්‍යවේදීන්ගේ අවබෝධය පුළුල් කිරීම මඟින් මහජන දැනුම පුළුල් කිරීමට උපකාරී වීම |
| | 2. සුහද හමු මගින් දැනුවත් කිරීමේ වැඩසටහන් සංවිධානය කිරීම | මාධ්‍ය ආයතන හා මාධ්‍යවේදීන් සමඟ දෙපාර්තමේන්තුවේ සමීප සම්බන්ධතාව වර්ධනය කිරීම | - | එම ආයතන විසින් සිදු කරනු ලබන විවිධ සංවර්ධන කාර්යයන් පිළිබඳව මහජනතාව දැනුවත් වීම |
| | 3. විශේෂ රාජ්‍ය ආයතනවල (1) මට්ටමේ දෙපාර්තමේන්තු නිලධාරීන් සම්බන්ධීකරණය සඳහා වර්ගීකරණය කිරීම | විශේෂිත ආයතනවල පුවත් කාර්යක්ෂමව හා නිවැරදිව ලබා දීම | - | රජය විසින් ගනු ලබන ඉතාම වැදගත් තීරණ පිළිබඳව මහජන අවධානය යොමු කිරීම |
| **03. යහපාලනය, සංහිඳියාව, තිරසර සංවර්ධනය ස්ථාපිත කරමින් ප්‍රකාශනයේ හා භාෂණයේ නිදහස තහවුරු කිරීම** | | | | |
| 1. ප්‍රකාශ නිකුත් කිරීම | 1. මාධ්‍ය ප්‍රකාශ හා මාධ්‍ය නිවේදන නිකුත් කිරීම | ඉහත සංකල්පය පිළිබඳ රජයේ දැක්ම ජනතාව වෙත ගෙන යාම | රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව සහ අනෙකුත් රාජ්‍ය ආයතන තුළ | රජය විසින් ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණ හා සංවර්ධන කටයුතු සම්බන්ධව දැනුවත් වීම නිසා රජයේ කටයුතු පිළිබඳව මහජන අවබෝධය පුළුල් වීම |
| 2. විශේෂ සංවර්ධන වැඩසටහන් | 1. විශේෂ සංවර්ධන වැඩසටහන් සඳහා | විශේෂ වැදගත්කමක් සහිත ක්ෂේත්‍රවල තොරතුරු විවිධ | රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව | සංවර්ධන වැඩසටහන් පිළිබඳ නිසි පරිදි දැන ගැනීමට හැකි වීම |

| | | | | |
|---|---|---|---|---|
| | ප්‍රචාරක කටයුතු සිදු කිරීම | මාධ්‍ය භාවිතා කර ජනතාවට ලබා දීම | සහ අනෙකුත් රාජ්‍ය ආයතන තුළ | |
| **04. වෘත්තීය මාධ්‍යවේදීන් බිහි කිරීම** | | | | |
| අත්දැකීම් හුවමාරු කර ගැනීම සඳහා වැඩසටහන් සංවිධානය කිරීම | 1. විදෙස් පුහුණුකරුවන් යොදා ගනිමින් දේශීය මාධ්‍යවේදීන් සඳහා පුහුණු වැඩසටහන් සංවිධානය කිරීම | විදෙස් මාධ්‍ය අත්දැකීම් සමඟ මාධ්‍යවේදීන් ප්‍රමිතිගත මාධ්‍ය සම්ප්‍රදායකට හුරු කිරීම | - | ප්‍රමිතිගත මාධ්‍ය සම්ප්‍රදාය තුළින් ජනතා අවබෝධය පුළුල් කළ හැකි වීම |
| | 2. විදේශීය අත්දැකීම් හා දැනුම හුවමාරු කර ගැනීමේ වැඩසටහන් සංවිධානය කිරීම (විදේශ සම්පත් දෙපාර්තමේන්තුව හරහා) | සෘජු විදෙස් මාධ්‍ය අත්දැකීම් සමඟ දේශීය මාධ්‍යවේදීන්ගේ වෘත්තීය මට්ටම ඉහළ නැංවීම | - | ඒ, ඒ විදෙස් රාජ්‍යයන්වල ලාංකික මාධ්‍යවේදීන් හට එම රාජ්‍යයන් පිළිබඳව ලබා දෙන දැනුම මඟින් මහජනතාවට පුළුල් අවබෝධයක් ලබා ගැනීමට හැකි වීම |

## 04. සංවර්ධන අංශය

මෙම දෙපාර්තමේන්තුවේ අරමුණු ඉටු කර ගැනීම උදෙසා දායක කර ගත හැකි අයුරින් 2018 වර්ෂයේ මැද භාගයේදී ආරම්භ වූ විශේෂිත අංශයකි. විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය සඳහා මෙන්ම ජනතාව වෙත නිවැරදි තොරතුරු පහසුවෙන් ලබා ගැනීමට හැකිවන පරිදි නව මාධ්‍ය හා සමාජ මාධ්‍ය යොදා ගැනීම සහ සම්බන්ධීකරණ කටයුතු සංවර්ධන අංශය මගින් සිදු කරනු ලබයි.

මෙහිදී විශේෂිත අවධානයක් යොමු කරනුයේ “Digital Platform” වෙතය. වෙබ් අඩවියක මෘදුකාංග සහ දෘඩාංග මඟින් තොරතුරු හුවමාරුව සහ ප්‍රචාරය සඳහා නිර්මාණය කරනු ලබන වේදිකාව “ඩිජිටල් වේදිකාවක්” ලෙස හඳුන්වා දිය හැකිය. නිදසුන් වශයෙන් ෆේස් බුක් (Face Book), ටුවිටර් (Twitter) පෙන්වා දිය හැකිය.

තව ද ඩිජිටල් මෘදුකාංග, ඩිජිටල් රූප, ඩිජිටල් වීඩියෝ, වෙබ් පිටු සහ වෙබ් අඩවි, සමාජ මාධ්‍ය, දත්ත සහ දත්ත සමුදායන්, ඩිජිටල් ශ්‍රව්‍ය වැනි MP 3 සහ e – book වැනි ඩිජිටල් මාධ්‍යවලට උදාහරණ ලෙස ද පෙන්වා දිය හැකිය.

ඒ අනුව ප්‍රධාන වශයෙන් පහත පරිදි සංවර්ධන අංශයේ කටයුතු ව්‍යාප්ත වී ඇත.

01. රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව මඟින් පවත්වාගෙන යනු ලබන www.dgi.gov.lk වෙබ් අඩවිය ජනතාවට සහ මාධ්‍යවලට තොරතුරු පහසුවෙන් ලබා ගැනීමට හැකි වේදිකාවක් ලෙස ප්‍රතිනිර්මාණය කිරීමේ කටයුතු ආරම්භ කර ඇත.

02. “Department of Government Information” You Tube ඔස්සේ වීඩියෝ ඇතුළත් ප්‍රවෘත්ති නාලිකාව, විශේෂ නිර්මාණාත්මක වීඩියෝ සහිත නාලිකාවක් ලෙස ක්‍රියාත්මක කිරීම ආරම්භ කර ඇත.

මෙහිදී දෙපාර්තමේන්තුව යටතේ තිබෙන “GFU Sri Lanka” , You Tube නාලිකාව සහ “news.lk You Tube” නාලිකාව මෙම නාලිකාවට link කර දෙපාර්තමේන්තුවේ සමස්ත නාලිකා එකතුවක් ලෙස ක්‍රියාත්මක කිරීම.

03. “Department of Government Information” Twitter, Face Book සඳහා නිර්මාණාත්මක ලෙස තොරතුරු සහ මාධ්‍ය නිවේදන නිකුත් කිරීම ආරම්භ කිරීම (වීඩියෝ පට, ඡායාරූප, නිර්මාණාත්මක Post යනාදී)

❖ රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ "Department of Government Information – Sri Lanka" You Tube Channel සඳහා වීඩියෝ පට නිර්මාණය කිරීම ආරම්භ කිරීම




❖ රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවිය, සංවර්ධන අංශය යටතේ යළි යාවත්කාලීන කිරීම ආරම්භයත් සමඟ 2018 නොවැම්බර් මස සිට,

1. ප්‍රවෘත්ති නිවේදන - 19ක්,
2. කැබිනට් තීරණ - සෑම සතියකටම 01 බැගින්

වශයෙන් භාෂා ත්‍රිත්වයෙන්ම වෙබ් අඩවිය තුළ යාවත්කාලීන කර ඇත.



## 05. නව මාධ්‍ය ඒකකය

### අරමුණ -

නූතන සන්නිවේදන මාධ්‍යයන් ඔස්සේ ජනතාව වෙත රජය මගින් ක්‍රියාත්මක සමාජ, ආර්ථික, සංස්කෘතික මෙන්ම රජයේ සංවර්ධන ප්‍රවෘත්ති හා ප්‍රතිපත්ති පිළිබඳ නිවැරදි තොරතුරු ජනතාව වෙත සන්නිවේදනය කිරීමයි.

### ඉලක්කය -

ජනතාව තුළ දැනුම, ආකල්ප හා රසඥතාව ඇති කරමින් ජනතාවගේ නිවැරදි තොරතුරු දැන ගැනීමේ අයිතිය තහවුරු කරමින් සංවර්ධන වැඩපිළිවෙළකට දායක වන සක්‍රීය පුරවැසියෙකු දායාද කිරීම

රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක වන අංශයක් වන නව මාධ්‍ය ඒකකය මගින් රජයේ නිල පුවත් වෙබ් අඩවිය - www.news.lk භාෂා ත්‍රිත්වයෙන් යාවත්කාලීන කර, පවත්වාගෙන යනු ලැබේ.

මීට අමතරව මෙම අංශය මගින් නිල පුවත් Face Book අඩවිය, නිල පුවත් Twitter අඩවිය, නිල පුවත් You Tube අඩවිය සහ ජංගම කෙටි පුවත් සේවාව ක්‍රියාත්මක කරයි.

සාම්ප්‍රදායික විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය වෙනුවට ඉතා ශීඝ්‍රයෙන් වර්ධනය වන සහ පැතිරී යන නව මාධ්‍ය සංස්කෘතිය දෙපාර්තමේන්තුව තුළ ස්ථාපනය කිරීම හා යොදා ගැනීමට ක්‍රියා කිරීම මෙම අංශයෙන් විශේෂයෙන් අපේක්ෂිත ක්‍රියාමාර්ග වේ.

මේ යටතේ news.lk වෙබ් අඩවිය විශේෂ අවධානයට ලක්විය යතු වන්නේ එය රජයේ නිල වෙබ් අඩවිය ලෙස ක්‍රියාත්මක වීම හා ඉන් ක්ෂණිකව පුවත් ප්‍රකාශ කිරීමට හැකි වීමත් නිසාය. මේ නිසාම වසර ගණනාවක සිට මෙරට හොඳම වෙබ් අඩවියක් ලෙස දෙපාර්තමේන්තුවේ ක්‍රියාත්මක වන නිල වෙබ් අඩවිය සම්මානයට පාත්‍ර වී ඇත.

එමෙන්ම දෙපාර්තමේන්තුවේ නව මාධ්‍ය සංස්කෘතියේ තවත් ජනප්‍රිය ක්ෂේත්‍රයක් ලෙස ගැනෙන සමාජ ජාල මාධ්‍ය කෙරෙහි ද අවධානය යොමු කරන අතර මේවන විට දෙපාර්තමේන්තු මුහුණු පොතේ (Face Book) පිටුව ද සීඝ්‍රයෙන් රජයේ පුවත් ජනතාව වතෙ සමීප කිරීමේ මෙවලමක් ලෙස ක්‍රියාත්මක වෙමින් පවතී.

තව ද පුවත් ක්ෂණිකව ජනතාවට සමීප කිරීමේ අරමුණින් ක්‍රියාත්මක කරනු ලබන ක්ෂනික කෙටි පණිවුඩ සේවාව ද ජංගම දුරකථන ග්‍රාහකයින් අතර ප්‍රචලිත, පුවත් දැන ගැනීමේ මාර්ගයක් වී ඇති බව නොරහසකි. මේ යටතේ මෙරට ප්‍රධාන ජංගම දුරකථන සේවාවන් දෙකක් වන ඩයලොග් හා මොබිටෙල් ආයතන හරහා news.lk කෙටි පණිවුඩ සේවාව දෙපාර්තමේන්තුවේ මැදිහත් වීමෙන් ක්‍රියාත්මක වේ.

2018 වසරේදී නිල වෙබ් අඩවිය වඩාත් ආකර්ශනීය ලෙස සහ නවීන තාක්ෂණික අංග එකතු කරමින් නව මුහුණුවරකින් යාවත්කාලීන කිරීම ද සිදු කර තිබේ.

## සිදු කරන කාර්යයන් -

වැඩසටහන / ව්‍යාපෘතිය

| | | |
|---|---|---|
| 01. | රජයේ නිල පුවත් වෙබ් අඩවිය සිංහල / දෙමළ /ඉංග්‍රීසි | *. රජයේ නිල වෙබ් අඩවිය භාෂා ත්‍රිත්වයෙන් යාවත්කාලීන කිරීම<br>*. නිල වෙබ් අඩවියට ප්‍රවෘත්ති සම්පාදනය<br>*. නිල වෙබ් අඩවියට වීඩියෝ ප්‍රවෘත්ති සම්පාදනය කිරීම |
| 02. | රජයේ නිල Face Book අඩවිය | *. ප්‍රවෘත්ති සම්පාදනය කිරීම<br>*. ඡායාරූප පල කිරීම<br>*. ග්‍රැෆික් මඟින් ප්‍රවෘත්ති පල කිරීම<br>*. වීඩියෝ ප්‍රවෘත්ති ප්‍රචාරය කිරීම<br>*. Info news ප්‍රචාරය කිරීම |
| 03. | නිල Twitter අඩවිය | *. ප්‍රවෘත්ති සම්පාදනය<br>*. ඡායාරූප පල කිරීම<br>*. ග්‍රැෆික් මඟින් ප්‍රවෘත්ති පල කිරීම<br>*. වීඩියෝ ප්‍රවෘත්ති ප්‍රචාරය කිරීම<br>*. Info news ප්‍රචාරය කිරීම<br>*. WhatsApp, Messenger මඟින් තොරතුරු සම්පාදනය |

| | | |
|---|---|---|
| | | *. වෙබ් අඩවිවල පලවන ප්‍රවෘත්ති වෙනත් අන්තර්ජාතික සමාජ මාධ්‍ය අන්තර්ජාල වේදිකා මත ප්‍රචාරය කිරීම<br>*. (Topixnews.com) |
| 04. | රජයේ නිල You Tube අඩවිය | *. කෙටි පුවත් වීඩියෝ ප්‍රවෘත්ති ප්‍රචාරය කිරීම<br>*. Info news ප්‍රචාරය කිරීම<br>*. සංවර්ධන වැඩසටහන්<br>*. වීඩියෝ කෙටි චිත්‍රපට ප්‍රදර්ශනය කිරීම |
| 05. | රජයේ නිල ජංගම දුරකථන කෙටි පුවත් සේවාව | *. කෙටි පුවත් සේවාව මඟින් ප්‍රවෘත්ති සම්පාදනය<br>*. දැනට ක්‍රියාත්මක මොබිටෙල් කෙටි පුවත් සේවාවට අමතරව ඩයලොග් ඇතුළු අනෙකුත් ජංගම දුරකථන ජාලා දක්වා මෙම කාර්යය ව්‍යාප්ත කිරීම |
| 06. | සමාජ මාධ්‍ය සජීවී විකාශනය | *. මාධ්‍ය සාකච්ඡා<br>*. රජයේ විශේෂිත වැඩසටහන්<br>*. වාර්තාමය වැඩසටහන්<br>*. කාලීන සිදුවීම් එසැනින් වාර්තා කිරීම<br>*. සමාජ මාධ්‍යයන්හි වීඩියෝ ප්‍රවර්ධනය කිරීමේ වැඩසටහන් |
| 07. | පාර්ලිමේන්තු මාධ්‍ය ආවරණය | *. පාර්ලිමේන්තු සැසිවාර ආවරණය |
| 08. | අමාත්‍යමණ්ඩල තීරණ මාධ්‍ය ආවරණය | *. ප්‍රවෘත්ති සම්පාදනය<br>*. සජීවී ප්‍රවෘත්ති විකාශනය |
| 09. | වෙනත් කාලීන පුවත් හා සිදුවීම් ආවරණය | *. ප්‍රවෘත්ති සම්පාදනය<br>*. සජීවී ප්‍රවෘත්ති විකාශනය |

| | | |
|---|---|---|
| 10. | රජයේ නිල ප්‍රවෘත්ති වෙබ් අඩවිය සහ නව මාධ්‍ය ඒකකය මඟින් පවත්වාගෙන යනු ලබන ප්‍රවෘත්ති සේවා | *. රජයේ සංවර්ධන වැඩසටහන් සඳහා ප්‍රමුඛතාව ලබා දෙමින් සමබරවූත්, සත්‍යවූත් කාලීන ප්‍රවෘත්ති ප්‍රමිතිගතව අන්තර්ජාලය මඟින් ජාලගත කිරීම |
| 11. | මාධ්‍ය විමර්ශන ක්‍රියාවලිය ශක්තිමත් කිරීම | - |
| 12. | රජයේ නිල වෙබ් අඩවිය මගින් යහපාලනය, සංහිඳියාව, තිරසර සංවර්ධනයට අදාළ ප්‍රවෘත්ති සැකසීම | *. රජයේ නිල වෙබ් අඩවිය මඟින් යහපාලනය, සංහිඳියාව, තිරසර සංවර්ධනයට අදාළ ප්‍රවෘත්ති සැකසීම |

## 06. දෙසතිය අංශය

දෙසතිය මාසික සඟරාවක් ලෙස 2018 වසරේදී ප්‍රකාශයට පත් වුවද එය අභිමානවත් යටගියාවක් හා බැඳී පවතින්නකි. විශේෂයෙන්ම රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව 1978 වසරේ සිට ආරම්භ කර සති 02කට වරක් නිකුත් වන රජයේ සංවර්ධන කාර්යභාරය ජනතාව වෙත සමීප කිරීමට යොදා ගත් ජනප්‍රිය මාධ්‍යයක් ලෙස මෙය හැඳින්විය හැක.

එමෙන්ම රජය විසින් කාලානුරූපීව සිදුකරන විවිධ සංවර්ධන ව්‍යාපෘති සම්බන්ධයෙන් ජනතාව අවදි කිරීමත් එකී කාර්යයන් පිළිබඳ පුළුල් කතිකාවතක් ඇති කිරීමටත් මෙමගින් පහසුකම් සැලසුනි.

එපමණක් නොව විවිධ රාජ්‍ය සේවයේ තරඟ විභාග අපේක්ෂකයන් තම දැනුම වර්ධනය කර ගැනීමට ද මෙම සඟරාව ප්‍රායෝගිකව උපයෝගී කර ගන්නක් බවට පත්ව ඇත.

කෙසේ වෙතත් මෙතෙක් රජයේ මුද්‍රණාලයෙන් මුදල් නොගෙවීමේ පදනම මත මුද්‍රණය කරන ලද දෙසතිය සඟරාව එම පදනමෙන් බැහැර වීමට යෝජනා වීමත්, මාසික සඟරාවක් ලෙස එළිදැක්වීමත් හේතුවෙන් එහි ජනප්‍රියත්වයේ යම් අපගමනයක් වීම ක්‍රමිකව සිදුවී තිබීම අවදානයට යොමු කිරීමේ ප්‍රතිඵලයක් ලෙස එය නව්‍යකරණයකට ලක් කිරීමේ මූලික කටයුතු 2017 වසරේදී සිට ආරම්භ කරන ලදී.

එහි සෘජු ප්‍රතිඵල 2018 වසරේදී අපේක්ෂා කරන ලද අතර ඒ තුළ මෙහි ගුණාත්මක භාවය වර්ධනය කිරීම හා තවදුරටත් දෙපාර්තමේන්තුවේ අරමුණු සාක්ෂාත් කිරීමට හැකි පසුබිමක් නිර්මාණය කිරීමට යත්න දරනු ඇත.

එහි ප්‍රතිඵලයක් ලෙස 2018 ජනවාරි සිට දෙසැම්බර් දක්වා දෙසතිය කලාප 13ක් මුද්‍රණය කරන ලදි.

දෙසතිය සඟරාවට අතිරේකව අනෙකුත් දෙපාර්තමේන්තු ප්‍රකාශනයන්ද මෙම අංශය යටතේ ප්‍රකාශයට පත් කෙරෙන අතර ඊට විවිධ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ජාතික වැදගත්කමකින් යුක්තව නිකුත් කරන ප්‍රකාශනයන්ද අයත් වේ. විශේෂයෙන් නිදහස් දිනය, වෙනත් ජාතික සැමරුම් දිනයන් අරඹයා රචිත ග්‍රන්ථ මෙන්ම කාලීනව ප්‍රකාශයට පත් කළ යුතු තොරතුරු දැන ගැනීමේ පනත පිළිබඳ දැනුවත් කිරීම් වැනි ග්‍රන්ථයන්ද මෙහිදී අවධානයට යොමු වේ.

ඒ අනුව 2018 වර්ෂයේ දෙසතිය අංශය විසින් ප්‍රකාශයට පත් කරන ලද අනිකුත් ප්‍රකාශන පහත සඳහන් පරිදි වේ.

## 01. බුද්ධ රශ්මි වෙසක් කලාපය

අග්‍රාමාත්‍ය කාර්යාලයේ උපදෙස් හා ඉල්ලීම මත බුද්ධ රශ්මි වෙසක් කලාපයෙන් පිටපත් 100,000ක් මුද්‍රණය කර අග්‍රාමාත්‍ය කාර්යාලය වෙත භාර දෙන ලදි. එම ග්‍රන්ථය අග්‍රාමාත්‍ය කාර්යාලයේ පැවති බුද්ධ රශ්මි වෙසක් සතියේ බෙදා හරින ලදි.

## 02. තිරසර ශ්‍රී ලංකාවක් සඳහා දැක්ම සහ ක්‍රමෝපායික මාවත

මෙම ග්‍රන්ථයෙන් සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් පිටපත් 3,000ක් මුද්‍රණය කර ජනාධිපති ලේකම් කාර්යාලය වෙත භාර දෙන ලදි.

## 03. "Vision 2025" ග්‍රන්ථය

2017 වසරේදී මුද්‍රණය කරන ලද මෙම ග්‍රන්ථයෙන් සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් පිටපත් නැවත මුද්‍රණය කර, මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයට භාර දෙන ලදි.

## 07. ඡායාරූප අංශය

මෙම දෙපාර්තමේන්තුවේ ඡායාරූප අංශය, පැරණි බොහෝ මතකයන් ගබඩා කර ඇති සංරක්ෂණාගාරයකි. රජයේ සියළුම සංවර්ධන අවස්ථාවන් මුද්‍රිත ඡායාරූප ලෙස මෙම අංශයේ සංරක්ෂිතව පවතින අතර එය වර්තමානය දක්වාම එකසේ සිය සේවාව සපයනු ලබයි.

සංරක්ෂණයට පවතින ඡායාරූපවල පවත්නා මිල කළ නොහැකි වටිනාකම සලකා බලා උපදේශකවරයෙකු යටතේ එකී සංරක්ෂණ කටයුතු ඉටු කිරීමට දෙපාර්තමේන්තුව මේ වනවිට අවධානය යොමු කර ඇත.

රජය වෙනුවෙන් දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරන ලද විවිධ ප්‍රදර්ශන අවස්ථාවලදී ඡායාරූප අංශය සතු ගුණාත්මක ඡායාරූප නොමද ප්‍රශංසාවට ලක්වූ අතරම එතුලින් අතීතය ප්‍රතිනිර්මාණයට හැකි වීමද විශේෂයෙන් සඳහන් කල හැක.

විශේෂයෙන්ම මෙරට සංචාරය කරන විදේශ නියෝජිතයන් වෙනුවෙන් මතක සැමරුම් ලෙස ලබා දෙන ඡායාරූප ඇල්බමයන් විදෙස් රාජතාන්ත්‍රිකයන්ගේ විශේෂ අවධානයට ලක් වීමෙන්ම මෙම අංශයේ පවත්නා වෙසෙස් අභිමානය පෙන්නුම් කරයි.







2018 වර්ෂය පුරාම ශ්‍රී ලංකාවේ සිදු වූ සියලු ආර්ථික, සංවර්ධන, සංස්කෘතික ක්‍රියාදාමයන්හි විශේෂ අවස්ථාවන් දෙපාර්තමේන්තු ඡායාරූප ශිල්පීන්ගේ කාචයෙහි සටහන් වූයේ පහත අයුරිනි.



*පොල්ගොල්ල ජල ව්‍යාපෘතිය විවෘත වූ වගයි*



*ලෝක මැලේරියා දිනය*




*සර්.ඩී.බී.ජයතිලක මහතාගේ 150 වැනි ජනිම දින සැමරුම*




*හරිත ස්ලීඩාවක් කරා ..........................*



කුරුණෑගල ජල සැපයුම් සංවර්ධන ව්‍යාපෘතිය



සියලු ආගමික නායකයින්ගේ හමුව

## 08. රජයේ චිත්‍රපට අංශය

වාර්තා වැඩසටහන් සකස් කිරීමේ මූලික අරමුණින් හා වාර්තා වැඩසටහන් බිහිකිරීමේ ප්‍රමුඛතම හා සුවිශේෂී කාර්යභාරයක් ඉටුකරන සුවිශේෂී අංශයක් වන රජයේ චිත්‍රපට අංශය සංවර්ධන වැඩසටහන් ග්‍රාමීයව ප්‍රචලිත කිරීමේ කටයුතු ආරම්භයේ පටන්ම සිදුකර ඇති අතර ඒ සඳහා දීප්තිමත් ඉතිහාසයක් පිළිබඳ ජීවමාන සාක්ෂි බොහොමයක් පවත්වා ගෙන යනු ලබයි.

දැනට ජනමාධ්‍ය අමාත්‍යාංශය මෙන්ම රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවද පිහිටා ඇති පරිශ්‍රය ආරම්භයේ සිට රජයේ චිත්‍රපට අංශය පිහිටි භූමිය වේ. මේ යටතේ නෙගටිව් තාක්ෂණය භාවිතා කළ කාලයේ පටන් ක්‍රියාත්මක වූ විද්‍යාගාරය, විදේශ පරිත්‍යාගයක් ලෙස ලද තත්ත්වයෙන් ඉතා උසස් ශබ්දාගාරය මෙන්ම තවත් බොහෝ තාක්ෂණික උපකරණවලින් යුක්තව සිය සේවාව සපයනු ලබයි.

තවද කීර්තිමත් නිලධාරීන් බොහෝ දෙනෙකුගේ සේවාවේ ආරම්භය සනිටුහන් කිරීමට ද මෙම අංශයේ මහපෙන්වීම හා ආශීර්වාදය හේතු කාරක වූ බව ඔවුන්ගේ චරිතාපදාන සාක්ෂි දරයි. එහිදී සිහිපත් කල හැකි කීර්තිමත් පුද්ගලයන් අතර ආසියානු සිනමාවේ දේශීය සළකුණ සනිටුහන් කළ ආචාර්ය ලෙස්ටර් ජේම්ස් පීරිස් විද්වතානන් සුවිශේෂීව සිහිපත් කළ හැක්කේ, විදෙස් ගතව සිට නැවත සිය රට පැමිණ රාජකාරී ආරම්භ කිරීම රජයේ චිත්‍රපට අංශයෙන් සිදු කළ හෙයිනි. ඔහුගේ මුල්ම සිනමා නිර්මාණය වූ **"රේඛාව"** චිත්‍රපටයට අවශ්‍ය පසුබිම නිර්මාණයේදී චිත්‍රපට අංශයේ අත්දැකීම් හේතු කාරක වී ඇත.

එපමණක් නොව තිස්ස ලියනසූරිය, සුගතපාල සෙනරත් යාපා, තිස්ස අබේසේකර, ටයිටස් තොටවත්ත වැනි සිනමා ක්ෂේත්‍රයේ දැවැන්තයන් සිය සිනමා දිවියේ මූලික අඩිතාලම රජයේ චිත්‍රපට අංශයෙන් ලබා ගැනීම ද මෙම අංශයේ සුවිශේෂී බව තවදුරටත් වැඩි වර්ධනය කරන්නකි.

මෙවන් අතීතයකින් යුක්ත වූවාක් මෙන්ම බොහෝ පිරිසකගේ මතකය අතීතයේ සොඳුරු අත්දැකීමක් වෙත යොමු කරන සෞන්දර්යාත්මක ප්‍රවේශයක්ද රජයේ චිත්‍රපට අංශයේ මෙහෙයවීමෙන් සිදුවිය. ඒ ශාලා පහසුකම් නොමැති ගම්මාන ඉලක්ක කර ගනිමින් ප්‍රදර්ශනය කරන ලද වාර්තා හා පැරණි චිත්‍රපටයන්ය. මේ සඳහාම විශේෂිතව වූ ප්‍රදර්ශන රථ යොදා ගනිමින් සිදු කරන ලද මෙම චාරිකාවන්හි මුඛ්‍ය අරමුණ වූයේ රජයේ සංවර්ධන ක්‍රියාවලීන් ජනතාව වෙත සමීප කිරීමයි. ඒ සඳහාම වාර්තා වැඩසටහන් නිර්මාණය කිරීමට පෙළඹී ඇති රජයේ චිත්‍රපට අංශය එකී නිර්මාණකරණයේ ප්‍රමුඛයා ලෙස ඉහළ කීර්තිනාමයක් ගොඩනගාගත් රාජ්‍ය ආයතනය වේ.

මෙකී කීර්තිමත් අතීතයේ මතක සැමරුමක් ලෙස 2017 වර්ෂයේදී **උත්තමාභිවන්දනා** වැඩසටහන විශේෂයෙන් ක්‍රියාත්මක කරන ලද අතර එහිදී වත්මනෙහි ක්ෂේත්‍රයේ සුවිශේෂී චරිත ලෙස බුහුමනට පාත්‍ර වන්නා වූ තොරාගත් ප්‍රවීණ කලාකරුවන් සිව් දෙනෙකු වෙනුවෙන් රජයේ චිත්‍රපට අංශයේ හා දෙපාර්තමේන්තුවේ ගෞරවය පිරිනමන ලදී. ඒ ආචාර්ය ලෙස්ටර් ජේම්ස් පීරිස්, සුගතපාල සෙනරත් යාපා, තිස්ස ලියනසූරිය හා කීර්ති ශ්‍රී පෙරේරා යන නිර්මාණවේදීන් ය.

ගෙවීගිය වසරවලදී මෙම අංශයට එක් වූ නව්‍යතාවක් ලෙස වාර්තා කථාංග (Docu – Drama) නිර්මාණය කිරීමට අවධානය යොමු වීම පෙන්වා දිය හැකි අතර ඒ හා සමඟ වාර්තා වැඩසටහන් සකස් කිරීම නවමු ක්ෂේත්‍රයක් කරා විහිදුනි.

කීර්තිමත් අතීතයකට උරුමකම් කීවද බොහෝ තනතුරු පුරප්පාඩු වීම් හා බඳවා ගැනීම් හා උසස් කිරීම් ප්‍රමාද වීම් ද හේතුවෙන් නොසලකා හැරීමට ලක් ව පැවති රජයේ චිත්‍රපට අංශය කෙරෙහි යහපත් අවධානයක් යොමු කිරීමට 2017 වසරේදී දෙපාර්තමේන්තුව කටයුතු කළ අතර ඒ අනුව නව තාක්ෂණික උපකරණ වලින් පොහොසත් ආයතනයක් බවට පත් කිරීමට අවශ්‍ය අඩිතාලමද සපයන ලදී. කෙසේ වෙතත් දෙපාර්තමේන්තු දැක්ම හා මෙහෙවර යථාර්ථයක් බවට පත් කිරීමේදී බොහෝ කාර්යයන් මෙම අංශය යටතේ 2018 ගෙවීගිය වසරේදී සිදු විය.

මෙම සියලු සාර්ථකත්වයන් ලබා ගැනීමේදී රජයේ චිත්‍රපට අංශය යටතේ පවතින පහත සඳහන් අංශ එකිනෙකට බැඳී ඇත්තේ දම්වැලක පුරුක් මෙනි.

01. නිෂ්පාදන අංශය
02. වීඩියෝ කැමරා අංශය
03. සංස්කරණ අංශය
04. ශබ්ද අංශය
05. සංරක්ෂණාගාරය

රජයේ චිත්‍රපට අංශයේ කාර්යභාරය පහත පරිදි වේ.

- රජය විසින් ක්‍රියාත්මක කරනු ලබන සංවර්ධන ව්‍යාපෘතිවල වැදගත්කම සහ ඒවායින් රටටත්, ජනතාවටත් අත්වන ප්‍රතිලාභ පිළිබඳ වාර්තා වැඩසටහන් නිෂ්පාදනය කිරීම සහ ඒවා රූපවාහිනී නාලිකාවල විකාශය කිරීමට සහ ජනතාව වෙත ප්‍රදර්ශනය කිරීම සඳහා අවශ්‍ය කටයුතු සංවිධානය කිරීම.

• මෙරට පවත්වනු ලබන සියලුම වැදගත් ජාතික හා අන්තර්ජාතික අවස්ථාවන් සම්බන්ධයෙන් වාර්තා වැඩසටහන් සහ වීඩියෝ පට නිෂ්පාදනය කිරීම.

• රාජ්‍ය නායක විදේශ නියෝජිත හමුවීම් හා සම්ප්‍රාප්තීන්වලට අදාළව දෙපාර්තමේන්තුව විසින් පිළිගන්වන වීඩියෝ වැඩසටහන් මෙම අංශයේ සම්බන්ධීකරණය ඔස්සේ නිෂ්පාදනය කිරීම.

• අවශ්‍ය අවස්ථාවන්වලදී මහජනතාව දැනුවත් කිරීම සඳහා රූපවාහිනී දැන්වීම් නිෂ්පාදනය කිරීම.

• දේශපාලන හා සමාජ සංස්කෘතික විෂයන් යටතේ වාර්තා වැඩසටහන් නිෂ්පාදනය කිරීම.

• කාලීන වැදගත්කමකින් යුත් මාතෘකා සම්බන්ධයෙන් සාකච්ඡාමය රූපවාහිනී වැඩසටහන් නිෂ්පාදනය කිරීම.

• විවිධ රාජ්‍ය ආයතනවල අවශ්‍යතා සඳහා ශ්‍රව්‍ය - දෘශ්‍ය වැඩසටහන් සහ වාර්තා වැඩසටහන් නිෂ්පාදනය කිරීම.

• වාර්තා වැඩසටහන් නිෂ්පාදනය කිරීම සඳහා අවශ්‍ය ක්ෂේත්‍ර පර්යේෂණ සිදු කිරීම.

• වාර්තා වැඩසටහන් අධ්‍යක්ෂණය කිරීම.

• වාර්තා වැඩසටහන් නිෂ්පාදනය සඳහා බාහිර ප්‍රවීන චිත්‍රපට අධ්‍යක්ෂවරුන් සම්බන්ධීකරණය කිරීම සහ ඔවුන්ගේ ගෙවීම් සම්බන්ධයෙන් කටයුතු කිරීම.

• විවිධ විෂයන් යටතේ උසස් තාක්ෂණයෙන් පටිගත කළ වීඩියෝ දර්ශනවල ඩිජිටල් සංචිතයක් පවත්වාගෙන යාම.

ඉහත කාර්යභාරය වෙනුවෙන් 2018 වර්ෂයේ කාර්ය සාධනය පහත විෂයයන් ඔස්සේ ක්‍රියාත්මක කෙරිණි.


01. තොරතුරු දැන ගැනීමේ අයිතිය ප්‍රවර්ධනය කිරීම සඳහා රජයේ සංවර්ධන ප්‍රචාරන වැඩපිළිවෙළ පිළිබඳ තොරතුරු ජනතාව සන්නිවේදනය කිරීම

02. ප්‍රමිතිගත මාධ්‍ය සම්ප්‍රදායක් ඇති කිරීම

03. යහපාලනය, සංහිඳියාව, තිරසර සංවර්ධනය ස්ථාපිත කරමින් ප්‍රකාශනයේ හා භාෂණයේ නිදහස තහවුරු කිරීම


මෙම සියලු අංශයන්හි සේවය කරන නිලධාරීන්ගේ අප්‍රතිහත ධෛර්ය, උත්සාහය හා කැපවීමේ ප්‍රතිඵලයන් ලෙස 2018 වර්ෂයේ රජයේ චිත්‍රපට අංශය විසින් සිදු කරන ලද වාර්තා වැඩසටහන්, කාලීන වැඩසටහන්, ප්‍රවෘත්ති වැඩසටහන් හා මාධ්‍ය ආවරන පහත සඳහන් පරිදි වේ.

## *. වාර්තා වැඩසටහන් -


| අනු අංකය | වැඩසටහනේ නම | අන්තර්ගතය | ඡායාරූප |
|---|---|---|---|
| 01. | කැගලු දිස්ත්‍රික් පරිසර සමුළුවට සමගාමීව නිෂ්පාදනය කරන ලද වීඩියෝ වැඩසටහන | අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් කැගල්ල දිස්ත්‍රික්කයේ පැවති 2018 පරිසර සමුළුව වෙනුවෙන් නිර්මිතය. කැගල්ල දිස්ත්‍රික්කය තුළ හඳුනාගත් පරිසර ගැටලු සහ ඒවාට විසඳුම් ලබා දී ඇති අයුරු මෙම වාර්තා වැඩසටහනින් සාකච්ඡා කෙරිණි. කැගල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ඉල්ලීම පරිදි නිෂ්පාදනය කරන ලදි |  |
| 02. | මොනරාගල පැවැත්වීමට නියමිතව තිබූ එන්ටර්ප්‍රයිස් ශ්‍රී ලංකා ප්‍රදර්ශනයේ මූලික සූදානම පිළිබඳ වීඩියෝ වැඩසටහන | 2018 අගෝස්තු මස මොනරාගල දිස්ත්‍රික්කයේ පැවැත් වූ එන්ටර්ප්‍රයිස් ශ්‍රී ලංකා ප්‍රදර්ශනය සඳහා ප්‍රදර්ශන භූමියේ තිබූ සූදානම සහ එම ප්‍රදර්ශනයට සමගාමීව එම ප්‍රදේශයේ සිදු කරන ලද සංවර්ධන වැඩසටහන් පිළිබඳව මෙම වීඩියෝ වැඩසටහන නිෂ්පාදනය කරන ලදී |  |
| 03. | මොනරාගල පැවැත්වූ එන්ටර්ප්‍රයිස් ශ්‍රී ලංකා ප්‍රදර්ශනයේ ප්‍රදර්ශනය කිරීම සඳහා රජයේ චිත්‍රපට අංශය පිළිබඳ සකසන ලද වීඩියෝ වැඩසටහන | 2018 අගෝස්තු මස මොනරාගල දිස්ත්‍රික්කයේ පැවැත් වූ එන්ටර්ප්‍රයිස් ශ්‍රී ලංකා ප්‍රදර්ශනයේ රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තු ප්‍රදර්ශන කුටියේ ප්‍රදර්ශනය සඳහා රජයේ චිත්‍රපට අංශය විසින් ඉටු කරන ජාතික කාර්ය භාරය |  |

| | | | |
|---|---|---|---|
| | | පිළිබඳව ප්‍රදර්ශනය නැරඹීමට පැමිණෙන ජනතාව දැනුවත් කිරීම සඳහා මෙම වීඩියෝ වැඩසටහන නිෂ්පාදන කරන ලදී | |
| 04. | RTI දිනය වෙනුවෙන් නිෂ්පාදනය කරන ලද වාර්තා වැඩසටහන 2018 | මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය විසින් සංවිධානය කළ RTI දිනය 2018 උත්සව අවස්ථාවේ ප්‍රදර්ශනය සඳහා මෙම වාර්තා වැඩසටහන නිෂ්පාදනය කරන ලදී. තොරතුරු දැනගැනීමේ පනත ක්‍රියාත්මක වීමත් සමග ජනතාව ඉන් ලබාගත් ප්‍රතිලාභ ප්‍රධාන සිද්ධි තුනක් ආශ්‍රයෙන් මෙම වාර්තා වැඩසහන තුළ සාකච්ඡා කරන ලදි |  |
| 05. | ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කිරීමේ උත්සවය පිළිබඳ පූර්ව ප්‍රචාරක පට 02 | මාතලේ අලුවිහාරයේ පැවැත්වූ ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කිරීමේ උත්සවය සහ එහි වැදගත්කම පිළිබඳ පූර්ව ප්‍රචාරයක් ලබා දීම සඳහා රූපවාහිනී නාලිකාවල ප්‍රචාරයට මෙම ප්‍රචාරක පට 02 නිර්මාණය කරන ලදී |  |
| 06. | සර්.ඩී.බී.ජයතිලක මැතිතුමා පිළිබඳ වාර්තා වැඩසටහන | සර්.ඩී.බී.ජයතිලක මැතිතුමාගේ 150 වන ජන්ම සංවත්සරය වෙනුවෙන් කෙටි වාර්තා චිත්‍රපටයක් ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ ඉල්ලීම පරිදි නිෂ්පාදනය කරන ලදී |  |

| | | | |
|---|---|---|---|
| 07. | අන්තර්ජාතික පරමාණුක බලශක්ති නියෝජිත ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ ශ්‍රී ලංකා නිල සංචාරය වීඩියෝ වැඩසටහන | අන්තර්ජාතික පරමාණුක බලශක්ති නියෝජිත ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ ශ්‍රී ලංකා නිල සංචාරය වීඩියෝ වැඩසටහන ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලයේ ඉල්ලීම පරිදි නිෂ්පාදනය කරන ලදී |  |
| 08. | ගරු අග්‍රාමාත්‍යතුමා විසින් ඉඩම් ඔප්පු දස ලක්ෂයක් බෙදා දීමේ වැඩසටහනේ වීඩියෝ පට - 05 | ගරු අග්‍රාමාත්‍යතුමා විසින් ඉඩම් ඔප්පු දස ලක්ෂයක් බෙදා දීමේ වැඩසටහන, ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ ඉල්ලීම පරිදි නිෂ්පාදනය කරන ලදී |  |
| 09. | "අහන්න" වීඩියෝ වැඩසටහන් 43 | ජාතීන් අතර සංහිඳියාව ඇති කිරීම උදෙසා අග්‍රාමාත්‍ය කාර්යාලයේ ඉල්ලීම පරිදි නිෂ්පාදනය කරන ලද වීඩියෝ වැඩසටහන් පෙළකි |  |
| 10. | මාතොටින් මාගමට වාර්තා වැඩසටහන | දක්ෂිණ අධිවේගී මාර්ග දිගුව හා එහි සංවර්ධනය පිළිබඳ සැකසූ වැඩසටහනකි. දක්ෂිණ අධිවේගී මාර්ගය හම්බන්තොට දක්වා දීර්ඝ කිරීම නිසා ජනතාවට ලැබෙන ප්‍රතිලාභ පිළිබඳ සාකච්ඡා කෙරේ |  |
| 11. | අතුරුදන්වූවන්ගේ කාර්යාලය පිළිබඳ වැඩසටහන් 02 | මාතර හා මුලතිව් දිස්ත්‍රික්කවල අතුරුදන්වූවන්ගේ කාර්යාල පිහිටුවීම පිළිබඳ ප්‍රචාරාත්මක වීඩියෝ වැඩසටහන් නිෂ්පාදනය කිරීම. අතුරුදන්වූවන්ගේ |  |

| | | | |
|---|---|---|---|
| | | කාර්යාලයේ ඉල්ලීම පරිදි නිෂ්පාදනය කරන ලදී | |
| 12. | රජුන් නොදුටු රජයක් නොදුටු සිරිලක මහා වාරි සිහිනයේ කළු ගඟ ජලාශය | කළු ගඟ ජලාශයේ ජල රැඳවුම් උත්සවයට සමගාමීව නිපදවූ වැඩසටහනකි. ජනාධිපති කාර්යාලයේ මාධ්‍ය අංශයේ ඉල්ලීම පරිදි නිෂ්පාදනය කරන ලදී |  |
| 13. | "ගෙදරට ලියුම්" වාර්තා රංගය සිංහල පිටපත දෙමළ පරිවර්තනය, විනාඩි 10 සංස්කරණය | ජාතික රූපවාහිනිය හා රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව එක්ව සංවිධානය කළ වාර්තා රංග ව්‍යාපෘතියේ එක් වාර්තා රංගයකි |  |
| 14. | 2018 ඡන්ද හිමි නාම ලේඛනයට නම ඇතුළත් කිරීම සම්බන්ධව ත්‍රිමාණ සජීවීකරණ වැඩසටහන | 2018 ඡන්ද හිමි නාම ලේඛනයට නම ඇතුළත් කිරීම සම්බන්ධව මැතිවරණ කොමිෂන් සභාව හා රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව ඒකාබද්ධව ජනතාව දැනුවත් කිරීමේ අරමුණෙන් සකස් කරන ලද වීඩියෝ වැඩසටහනකි. මැතිවරණ කොමිෂන් සභාවේ ඉල්ලීම පරිදි නිෂ්පාදනය කරන ලදී |  |
| 15. | 2018 පළාත් පාලන ආයතන ඡන්ද විමසීම පිළිබඳ ත්‍රිමාණ සජීවිකරණ වැඩසටහන | 2018 පළාත් පාලන ආයතන ඡන්ද විමසීම පිළිබඳ ත්‍රිමාණ සජීවිකරණ වැඩසටහන මැතිවරණ කොමිෂන් සභාව හා රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව ඒකාබද්ධව ජනතාව දැනුවත් කිරීමේ අරමුණින් සකස් කරන ලද වීඩියෝ වැඩසටහනකි. මැතිවරණ |  |

| | | | |
|---|---|---|---|
| | | කොමිෂන් සභාවේ ඉල්ලීම පරිදි නිෂ්පාදනය කරන ලදී. | |
| 16. | මොරගහකන්ද කළු ගඟ ජලාශ ව්‍යාපෘතිය පිළිබඳ වැඩසටහන | මොරගහකන්ද කළු ගඟ ජලාශ ව්‍යාපෘතියේ මොරගහකන්ද ජලාශයේ ජල මට්ටම 90% කින් පිරි පැවතීම, කළු ගඟ ජලාශ ව්‍යාපෘතියේ සංවර්ධන කටයුතු, ලග්ගල පැරණි නගරය ජලයෙන් යටවීම, ඉදිවෙමින් පවතින ලග්ගල නව නගරය හා ඉදිවෙමින් පවතින රෝහල පිළිබඳ සැකසූ වැඩසටහනකි. ජනාධිපති කාර්යාලයේ මාධ්‍ය අංශයේ ඉල්ලීම පරිදි නිෂ්පාදනය කරන ලදී |  |
| 17. | ඉන්දුනීසියානු ජනාධිපතිතුමාගේ ශ්‍රී ලංකා සංචාරය පිළිබඳ වැඩසටහන | ඉන්දුනීසියානු ජනාධිපතිතුමාගේ ශ්‍රී ලංකා සංචාරය පිළිබඳ වීඩියෝ වැඩසටහනකි |   |
| 18. | නව කැළණි පාලම ඉදිකිරීම් ව්‍යාපෘතිය පිළිබඳ වැඩසටහන | නව කැළණි පාලම ඉදිකිරීම් ව්‍යාපෘතියේ සංවර්ධන කටයුතු පිළිබඳ සැකසූ වැඩසටහනකි. නව කැළණි පාලම ඉදිකිරීම් ව්‍යාපෘතිය මගින් රටට සහ ජනතාවට ලැබෙන ප්‍රතිලාභ පිළිබඳ සාකච්ඡා කෙරේ |  |
| 19. | පිටත වටරවුම් පාර ඉදි කිරීම පිළිබඳ වාර්තා වැඩසටහන | පිටත වටරවුම් මාර්ගය ඉදිකිරීම මඟින් ජනතාවට ලැබෙන ප්‍රතිලාභ පිළිබඳ සාකච්ඡා කෙරේ |   |

| | | | |
|---|---|---|---|
| 20. | බිම් බෝම්බ ඉවත් කිරීම පිළිබඳ වාර්තා වැඩසටහන | ජිනීවා මානව හිමිකම් කවුන්සිලයේ ප්‍රදර්ශනය සඳහා ශ්‍රී ලංකා බිම් බෝම්බ මර්දන ව්‍යාපාරයේ ඉල්ලීම පරිදි නිෂ්පාදනය කරන ලදී. මෙම වාර්තා වැඩසටහන ප්‍රදර්ශනය දෙස් - විදෙස් ආරාධිතයින්ගේ වෙසෙස් අවධානය ශ්‍රී ලංකාව කෙරෙහි යොමු කිරීමට සමත් විය |  |
| 21. | "Docudrama towards democracy in Sri Lanka" වාර්තා නාට්‍ය මාලාව | රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව හා ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව ඒකාබද්ධව තොරතුරු පනත, ජීවත් වීමට ඇති අයිතිය, ස්වාධීන කොමිෂන් සභා වැනි විෂය ක්ෂේත්‍ර පිළිබඳව නිර්මාණශීලී ප්‍රවේශයක් තුළින් මහජනතාව දැනුවත් කිරීමේ අරමුණින් කතාංග 10කින් යුතු වාර්තා නාට්‍ය මාලාවක් ලෙස මෙම ව්‍යාපෘතිය ආරම්භ විය. ඒ අනුව ශ්‍රී.රූ.සංස්ථාව කතාංග 7කුත් ර.ප්‍ර.දෙ එක් කතාංගයකුත් වශයෙන් නිෂ්පාදනය කරන ලද වාර්තා නාට්‍ය 08ක් ජාතික නාලිකාවේ විකාශය කරන ලදී |   |

*. කාලීන වැඩසටහන් -

| අනු අංකය | වැඩසටහන | දිනය |
|---|---|---|
| 01. | සිංගප්පූරු අග්‍රාමාත්‍යතුමන්ගේ ශ්‍රී ලංකා සංචාරය | 2018.01.22 - 24 |

| | | |
|---|---|---|
| 02. | ඉන්දුනීසියානු ජනාධිපතිතුමාගේ ශ්‍රී ලංකා සංචාරය | 2018.01.24 - 25 |
| 03. | සතොස්ක්ෂණය - දේශපාලනය සඳහා කාන්තා මැදිහත් වීම | 2018.01.25 |
| 04. | සතොස්ක්ෂණය | 2018.03.29 |
| 05. | ඉන්දියන් සාගරය අපේ අනාගතය නිර්වචනය කිරීමේ සම්මන්ත්‍රණය | 2018.10.11 |
| 06. | සතොස්ක්ෂණය | 2018.10.03 |
| 07. | සිහින ලොවක් ප්‍රසංගය | 2018.12.03 |

## *. ප්‍රවෘත්ති වැඩසටහන් -

| අනු අංකය | වැඩසටහන | දිනය |
|---|---|---|
| 01. | ජාතික නිදහස් දින උත්සවය | 2018.02.04 |
| 02. | පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ එක්දින සේවා කඩිනම් කිරීම | 2018.02.06 |
| 03. | මැතිවරණ කොමසාරිස්වරයාගේ අදහස් දැක්වීම | 2018.02.07 |

## *. මාධ්‍ය ආවරණ -

| අනු අංකය | සිද්ධිය | දිනය |
|---|---|---|
| 01. | මොරගහකන්ද ජලාශය | 2018.01.04,05,06 |
| 02. | කුරුණෑගල දේවස්ථානයේ දේව මෙහෙය | 2018.01.06 |
| 03. | මොරගහකන්ද සංවර්ධන ව්‍යාපෘතිය ජනසතු කිරීම | 2018.01.07,08 |
| 04. | මහවැලි සංවර්ධන ව්‍යාපෘතිය, පංච මහා ජලාශ සීමාව සනිටුහන් කිරීමේ උත්සවය | 2018.01.08 |
| 05. | රාජගිරිය ගුවන් පාලම විවෘත කිරීම | 2018.01.08 |

| | | |
|---|---|---|
| 06. | මොරගහ කන්ද ජලාශය, පොල්ගොල්ල ජාතික උත්සවය | 2018.01.08,09 |
| 07. | අග්‍රාමාත්‍යතුමන් ජපාන දූත පිරිස හමුවීම | 2018.01.09 |
| 08. | ශ්‍රී ලංකාව බිම් බෝම්බ තහනම් කිරීමේ ප්‍රඥප්තිය අත්සන් ප්‍රතාලාභ පිළිබඳ මාධ්‍ය සාකච්ඡාව | 2018.01.10 |
| 09. | පාසල් පෙළ පොත් බෙදා දීමේ ජාතික උත්සවය | 2018.01.11 |
| 10. | ජල සම්පාදන අමාත්‍යාංශයට ජල බවුසර් බෙදා දීම | 2018.01.16 |
| 11. | ජපන් ආධාර යටතේ ශ්‍රීපාලි මණ්ඩපයේ ස්ථාපිත කිරීමට යෝජිත ශ්‍රව්‍ය දෘශ්‍ය චිත්‍රාගාරය සඳහා ගිවිසුම් අත්සන් කිරීම | 2018.01.17 |
| 12. | බැඳුම්කර වාර්තාව පිළිබඳ කතානායකතුමාගේ ප්‍රවෘත්ති සාකච්ඡාව | 2018.01.17 |
| 13. | ජනාධිපතිතුමන්ගේ මහනුවර සංචාරය | 2018.0118 |
| 14. | ඇල්පිටිය රෝහල විවෘත කිරීම හා අගමැතිතුමන්ගේ ඇල්පිටිය සංචාරය | 2018.01.19,20 |
| 15. | මාතර දිස්ත්‍රික්කයේ ගුරුවරුන් සඳහා මාධ්‍ය වැඩමුළුව | 2018.01.19 |
| 16. | පළාත් පාලනය තුළ 25% කෝටාව | 2018.01.25 |
| 17. | ගාල්ල රිච්මන්ඩ් විද්‍යාලයේ නිදහස් දින උළෙල | 2018.01.26 |
| 18. | නිට්ටඹුව සංඝබෝධි විද්‍යාලයේ නව ගොඩනැගිල්ල විවෘත කිරීමේ උත්සවය | 2018.01.26 |
| 19. | නිදහසේ වැදගත්කම පිළිබඳ පාසල් සිසුන් වෙනුවෙන් සම්මන්ත්‍රණය - ගාල්ල රිච්මන්ඩ් විද්‍යාලය | 2018.01.26 |
| 20. | මානව හිමිකම් කොමිෂන් සභාව ප්‍රකාශයක් ලබා ගැනීම | 2018.01.30 |
| 21. | ඌව වෙල්ලස්ස විශ්ව විද්‍යාලයේ ජාත්‍යන්තර පර්යේෂණ සම්මේලනය | 2018.01.31,<br>2018.02.01 |
| 22. | ආබාධිත ළමයින්ගේ ක්‍රියාකාරකම් ඇතුළත් ප්‍රදර්ශනය සහ සංස්කෘතික වැඩසටහන | 2018.02.03 |
| 23. | ජාතික නිදහස් දින උත්සවය | 2018.02.04 |
| 24. | එඩින්බරෝ ආධිපාදවරයාගේ ජාත්‍යන්තර සම්මාන ප්‍රදානෝත්සවය | 2018.02.04 |
| 25. | රාජ්‍ය ණය කළමණාකරණය පිළිබඳ මාධ්‍ය සාකච්ඡාව | 2018.02.07 |
| 26. | අග්‍රාමාත්‍යතුමා ඡන්දය ප්‍රකාශ කිරීම | 2018.02.10 |

| | | |
|---|---|---|
| 27. | චන්ද්‍රිකා බණ්ඩාරනායක මැතිණිය ඡන්දය ප්‍රකාශ කිරීම | 2018.02.10 |
| 28. | කතානායකතුමා ඡන්දය ප්‍රකාශ කිරීම | 2018.20.10 |
| 29. | ඩී.බී.ජයතිලක මැතිතුමාගේ 150 වැනි සංවත්සරය - ජනාධිපති ලේකම් කාර්යාලය | 2018.02.13 |
| 30. | ඩී.බී.ජයතිලක මැතිතුමාගේ 150 වැනි සංවත්සරය - මහා භාරකාර අරමුදල | 2018.02.14 |
| 31. | කච්චතිව් පල්ලියේ මංගල්‍යය | 2018.02.23,24,25 |
| 32. | ආනන්ද - නාලන්ද ක්‍රිකට් තරඟාවලිය | 2018.03.03,04 |
| 33. | මහනුවර දිස්ත්‍රික්කයේ ඇති වී ඇති ආපදා තත්වය | 2018.03.08 |
| 34. | අන්තර්ජාතික පරමාණුක බලශක්ති නියෝජිතයන්ගේ අධ්‍යක්ෂ ජනරාල්ගේ ශ්‍රී ලංකා සංචාරය | 2018.03.14 |
| 35. | ජනමාධ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමන් සහභාගී වූ උත්සව | 2018.03.04 |
| 36. | ආනන්ද- නාලන්ද ටෙස්ට් ක්‍රිකට් තරඟාවලිය | 2018.03.16 |
| 37. | Slida හරිත සතිය | 2018.03.20 |
| 38. | මහනුවර දිස්ත්‍රික් ආපදා තත්වය | 2018.03.21 |
| 39. | නව දේශීය ආදායම් පනත පිළිබඳව මාධ්‍ය දැනුවත් කිරීමේ ප්‍රවෘත්ති සාකච්ඡාව | 2018.04.02 |
| 40. | කැබිනට් තීරණ දැනුම් දීමේ ප්‍රවෘත්ති සාකච්ඡාව | 2018.04.04 |
| 41. | ආහාර නිෂ්පාදන ජාතික වැඩ සටහන නිරීක්ෂණ චාරිකාව | 2018.04.05 |
| 42. | සිංහල හා හින්දු අලුත් අවුරුදු කාලය තුළ විශේෂ බස් රථ සේවාවේ ප්‍රගතිය පිළිබඳ දැනුවත් කිරීමේ මාධ්‍ය සාකච්ඡාව | 2018.04.11 |
| 43. | වෙසක්, පොසොන් සමයේ දන්සැල් පැවැත්වීම පිළිබඳ මාර්ගෝපදේශන මාධ්‍ය හමුව | 2018.04.23 |
| 44. | මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්ගේ ප්‍රකාශය | 2018.04.26 |
| 45. | රාජ්‍ය වෙසක් උත්සවය | 2018.04.26 සිට<br>2018.05.02 දක්වා |
| 46. | අරලියගහ මන්දිරයේ සර්වඥ ධාතු ප්‍රදර්ශනය | 2018.04.29 සිට<br>2018.05.02 දක්වා |
| 47. | කඩවත වෙසක් කලාපය | 2018.05.01 |

| | | |
|---|---|---|
| 48. | ලෙස්ටර් ජේම්ස් පීරිස් මහතාගේ අවමංගල්‍යය | 2018.05.02 |
| 49. | සංහිඳියා නායකත්ව වැඩමුළුව - යාපනය | 2018.05.03,04,05 |
| 50. | පාසල් දරුවන් අතර තැලසීමියා රෝගීන් සොයා ගැනීමේ ජාතික වැඩ සටහන | 2018.05.04 |
| 51. | කුරුණෑගල ජලසම්පාදන හා සනීපාරක්ෂක ව්‍යාපෘතිය | 2018.05.05 |
| 52. | මැයි දින පෙළපාලිය සහ උත්සවය | 2018.05.06,07 |
| 53. | ලෝක රබර් සමුළුව | 2018.05.07 |
| 54. | අටවැනි පාර්ලිමේන්තුවේ දෙවන සැසිය විවෘත කිරීම | 2018.05.08 |
| 55. | කුරුණෑගල රණවිරු ස්මාරකය විවෘත කිරීම | 2018.05.09 |
| 56. | පාර්ලිමේන්තු රැස්වීම | 2018.05.10 |
| 57. | මැයි දිනය | 2018.05.10 |
| 58. | ජනාධිපතිතුමාගේ නිළ උත්සවය - චිත්‍රපට සංස්ථාව | 2018.05.15 |
| 59. | අගමැතිතුමාගේ ප්‍රධානත්වයෙන් කෘෂිකාර්මික නවීකරණ ලෝක බැංකු ව්‍යාපෘති ගිවිසුම අත්සන් කිරීම | 2018.05.15 |
| 60. | I.T.N. සභාපති වැඩ භාර ගැනීම | 2018.05.17 |
| 61. | ද්විත්ව පුරවැසිභාවය ප්‍රදානය කිරීම | 2018.05.16 |
| 62. | ජාතික රණවිරු සැමරුම් උත්සවය | 2018.05.19 |
| 63. | මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ පිරිත් ධර්ම දේශනය | 2018.05.18 |
| 64. | නිට්ටඹුව විද්‍යානන්ද පිරිවෙනේ උත්සවය | 2018.05.21 |
| 65. | වත්මන් ආපදා තත්වය පිළිබඳ ආපදා කළමණාකරණ අමාත්‍යාංශයේ ප්‍රකාශය | 2018.05.21 |
| 66. | දකුණු පළාතේ උණ රෝගය පිළිබඳ මාධ්‍ය සාකච්ඡාව | 2018.05.22 |
| 67. | ආපදා මධ්‍යස්ථානයේ මාධ්‍ය හමුව | 2018.05.22 |
| 68. | ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් මාධ්‍ය හමුව | 2018.05.31 |
| 69. | මහර හා අත්තනගල්ල සංවර්ධන ව්‍යාපෘතිය නිරීක්ෂණ චාරිකාව | 2018.06.01 |
| 70. | අතුරුදහන් වූවන්ගේ කාර්යාලය පිහිටුවීම - මුලතිව් | 2018.06.03 |

| | | |
|---|---|---|
| 71. | මහා මාර්ග සංවර්ධනය පිළිබඳ මාධ්‍ය සාකච්ඡාව | 2018.06.05 |
| 72. | ජල සම්පාදන අමාත්‍යවරයාගේ මාධ්‍ය සාකච්ඡාව | 2018.06.08 |
| 73. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ පිළිබඳ මාධ්‍ය දැනුවත් කිරීම | 2018.06.14 |
| 74. | පාසැල් වෘත්තීය සමිති විශේෂ මාධ්‍ය සාකච්ඡාව | 2018.06.14 |
| 75. | Future Minds අධ්‍යාපනික ප්‍රදර්ශනය | 2018.06.15 |
| 76. | නාමල් උයන රෝස තිරුවානා කන්ද මාධ්‍ය නිරීක්ෂණ චාරිකාව | 2018.06.16 |
| 77. | රාජ්‍ය ගිණුම් කාරක සභා මාධ්‍ය හමුව | 2018.06.21 |
| 78. | කොළඹ නගරයේ ඉදි කිරීම් | 2018.06.25 |
| 79. | වද හිංසා නැතුව බැරිද? සංවාදශීලි කතිකාව | 2018.06.26 |
| 80. | ශ්‍රී ලංකා ජාතික හා ආගමික සහජීවනය දෙවන සමුළුව පිළිබඳ මාධ්‍ය දැනුවත් කිරීම | 2018.06.29 |
| 81. | ජනමාධ්‍ය ඇමතිතුමා මාතර සංස්කෘතික මධ්‍යස්ථානයේ උත්සවයකට සහභාගී වීම | 2018.06.30 |
| 82. | පළාත් පාලන ආයතනවලට පත් වූ මන්ත්‍රීවරුන්ගේ වැඩමුළුව | 2018.07.02 |
| 83. | වරාය නගර ව්‍යාපෘතිය ඉදි කිරීම් | 2018.07.04 |
| 84. | ගයන්ත කරුණාතිලක ඇමතිතුමාගේ විශේෂ ප්‍රවෘත්ති සාකච්ඡාව | 2018.07.06 |
| 85. | රාමඤ්ඤ නිකායේ 71 වැනි උපසම්පදා උත්සවය පිළිබඳ මාධ්‍ය දැනුවත් කිරීම | 2018.07.12 |
| 86. | කැගල්ල ජල සම්පාදන ව්‍යාපෘතිය නිරීක්ෂණ චාරිකාව | 2018.07.19 |
| 87. | කළු ගග ජල ව්‍යාපෘතිය | 2018.07.20 |
| 88. | පිබිදෙමු පොළොන්නරුව සංවර්ධන මාධ්‍ය ආවරණ | 2018.07.31 |
| 89. | ජාතික තිරසර කතිකාව | 2018.08.05 |
| 90. | නව පිටත වටරවුම් අධිවේගී මාර්ගය | 2018.08.08 |
| 91. | මොනරාගල සංවර්ධනය | 2018.08.09,12 |
| 92. | "අහන්න" සංහිඳියා වැඩසටහන - ජනතාව දැනුවත් කිරීම - දෙහිවල | 2018.08.08 |
| 93. | වැලිවේරිය, පානදුර | 2018.08.09 |

| | | |
|---|---|---|
| 94. | පයාගල | 2018.08.10 |
| 95. | බේරුවල , තිහාරිය | 2018.08.11 |
| 96. | ඇල්පිටිය | 2018.08.12 |
| 97. | අම්බලන්ගොඩ | 2018.08.13 |
| 98. | හික්කඩුව | 2018.08.15 |
| 99. | ගින්තොට | 2018.08.16 |
| 100. | වැලිගම | 2018.08.17 |
| 101. | අකුරැස්ස | 2018.08.18 |
| 102. | කඹුරුපිටිය | 2018.08.19 |
| 103. | යටියන | 2018.08.20 |
| 104. | දික්වැල්ල | 2018.08.22 |
| 105. | බෙලිඅත්ත | 2018.08.23 |
| 106. | තංගල්ල | 2018.08.24 |
| 107. | අම්බලන්තොට | 2018.08.25 |
| 108. | සූරියවැව | 2018.08.26 |
| 109. | තිස්සමහාරාමය | 2018.08.27 |
| 110. | වැල්ලවාය | 2018.08.29 |
| 111. | මදුරකැටිය පාසල - මොනරාගල | 2018.08.30 |
| 112. | හිදිකියුල්ල ඉන්ද්‍රාරාමය - මොනරාගල | 2018.09.01 |
| 113. | අවිස්සාවේල්ල | 2018.08.15 |
| 114. | කොස්ගම | 2018.08.16 |
| 115. | පාදුක්ක | 2018.08.17 |
| 116. | හෝමාගම ජනාධිපති විද්‍යාලය | 2018.08.18 |
| 117. | හංවැල්ල රාජසිංහ විද්‍යාලය | 2018.08.19 |
| 118. | අතුරුගිරිය මහාමාත්‍ය විද්‍යාලය | 2018.08.25 |

| | | |
|---|---|---|
| 119. | කොට්ටාව ධර්මපාල විද්‍යාලය | 2018.08.26 |
| 120. | මහරගම බුවනෙකබාහු විද්‍යාලය | 2018.08.26 |
| 121. | පිළියන්දල මධ්‍ය මහා විද්‍යාලය | 2018.08.23 |
| 122. | මොනරාගල | 2018.08.28 |
| 123. | බඩල්කුඹුර | 2018.08.29 |
| 124. | ආගමන විගමන දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ පත්වීම් ප්‍රදානය | 2018.08.14 |
| 125. | අගමැතිතුමාගේ ප්‍රධානත්වයෙන් ඉඩම් ඔප්පු ප්‍රදානය | 2018.08.21 |
| 126. | මොනරාගල මාධ්‍යවේදීන් දැනුවත් කිරීම | 2018.08.26,27 |
| 127. | රාජ්‍ය ගිණුම් කාරක සභාවේ ඇගයීම් වැඩසටහන | 2018.09.05 |
| 128. | මහජන මන්ත්‍රණ සභාව | 2018.09.04 |
| 129. | අග්‍රාමාත්‍යතුමා අතින් දරුසලාම් මුස්ලිම් විද්‍යාලයේ නව දෙමහල් ගොඩනැගිල්ල විවෘත කිරීම | 2018.09.19 |
| 130. | රත්නපුර ඇඹිලිපිටිය මහා විද්‍යාලයේ ගුවන් හමුදාපති පිළිගැනීමේ උත්සවය | 2018.09.27 |
| 131. | තොරතුරු දැනගැනීමේ ජාත්‍යන්තර දින වීදි නාට්‍යය | 2018.09.21 |
| 132. | මාධ්‍ය සාකච්ඡා ග්‍රන්ථය එළි දැක්වීම | 2018.09.21 |
| 133. | තොරතුරු දැනගැනීමේ දිනයට සමගාමීව පැවැත්වෙන සම්මන්ත්‍රණය | 2018.09.27 |
| 134. | කසල බැහැර කිරීමේ පිළිවෙල සම්බන්ධව පුත්තලම අරුවක්කාරු නිරීක්ෂණ චාරිකාව | 2018.09.27 |
| 135. | මීගමුවේ සිට මත්තල දක්වා වෙරළ තීරය පවිත්‍ර කිරීම | 2018.09.30 |
| 136. | ජාත්‍යන්තර භාෂා පරිවර්තන දින සැමරුම | 2018.09.31 |
| 137. | ලෝක ළමා දින උත්සවය | 2018.10.01 |
| 138. | විදේශ කටයුතු ඇමතිතුමාගේ මාධ්‍ය සාකච්ඡාව | 2018.10.09 |
| 139. | ආපදා තත්වයන් පිළිබඳ තොරතුරු | 2018.10.10 |
| 140. | මහර සංවර්ධන ව්‍යාපෘති විවෘත කිරීම | 2018.10.13 |
| 141. | සංහිඳියා කාර්යාංශය හැටන්හි සංවිධානය කරන ලද බෞද්ධ සංඝයා වහන්සේලාගේ වැඩසටහන | 2018.10.20 |

| | | |
|---|---|---|
| 142. | වෘත්තීය පුහුණු නියෝජ්‍ය ඇමතිතුමා සහභාගී වූ උත්සවය | 2018.10.24 |
| 143. | පුවත්පත් මණ්ඩලයේ සහතිකපත් ප්‍රදානෝත්සවය | 2018.10.29,30 |
| 144. | බස්නාහිර පළාත් ප්‍රධාන අමාත්‍යතුමාගේ විශේෂ ප්‍රවෘත්ති සාකච්ඡාව | 2018.11.01 |
| 145. | කළු ගග ජලාශයට ජලය රැස් කිරීම හා ඒ ආශ්‍රිතව සිදු කෙරෙන සංවර්ධන කටයුතු | 2018.11.16 |
| 146. | වර්තමාන කාලගුණ තත්වය පිළිබඳ තොරතුරු | 2018.11.26 |
| 147. | ළමා අපයෝජන වළකමු | 2018.11.27 |
| 148. | විශේෂ ප්‍රවෘත්ති සාකච්ඡාව - මහවැලි කේන්ද්‍රය | 2018.11.28 |
| 149. | හෙක්ටර් කොබ්බෑකඩුව ආයතනය | 2018.11.29 |
| 150. | 2019 ආර්ථික අභියෝග | 2018.11.30 |
| 151. | යුද හමුදාව නිෂ්පාදනය කළ නව යුද අවි පිළිබඳව වැඩමුළුව | 2018.12.06 |
| 152. | ජාතික ආහාර සැණකෙළිය | 2018.12.07 |
| 153. | පාරිභෝගික අධිකාරියේ ප්‍රකාශය | 2018.12.07 |
| 154. | ශ්‍රේෂ්ඨාධිකරණය විසින් පාර්ලිමේන්තුව විසුරුවීම පිළිබඳ නඩු තීන්දුව | 2018.12.08 |
| 155. | Harvest – 2018 කෘෂිකාර්මික ප්‍රදර්ශනය සමාරම්භක උළෙල | 2018.12.11 |
| 156. | පාර්ලිමේන්තුව රැස්වීම | 2018.12.18 |
| 157. | ප්‍රතිජීවක ඖෂධ නිසි භාවිතයේ අවශ්‍යතාවය | 2018.12.20 |
| 158. | ඉන්ධන මිල අඩුවීම | 2018.12.21 |
| 159. | උතුරේ ගංවතුර තත්වය | 2018.12.24 |
| 160. | විශේෂ මාධ්‍ය සාකච්ඡාව - මුදල් අමාත්‍යාංශය | 2018.12.24 |
| 161. | ත්‍රිපිටකය ජාතික උරුමයක් බවට පත් කිරීම | 2018.12.27 |
| 162. | ශ්‍රී ලංකා රාජ්‍ය සේවා ක්‍රිකට් සංගමය මගින් සංවිධානය කරන ලද සය සාමාජික ක්‍රිකට් තරඟාවලිය | 2018.12.31 |

## 09. දිස්ත්‍රික් මාධ්‍ය ඒකකය

මෙම දෙපාර්තමේන්තුවේ නව අංශයක් ලෙස ස්ථාපිත කරන ලද දිස්ත්‍රික් මාධ්‍ය ඒකක අංශය මඟින් විශේෂයෙන් දිස්ත්‍රික්ක පුරා ප්‍රාදේශීය වැඩමුළු පවත්වා ප්‍රාදේශීය මාධ්‍යවේදීන් නව සංවර්ධන ව්‍යාපෘති පිළිබඳව දැනුවත් කිරීමේ කටයුතු සංවිධානය කෙරෙනු ඇත. එහිදී,

01. ප්‍රාදේශීය මාධ්‍ය වැඩමුළු

02. පාසල් මාධ්‍ය වැඩමුළු

වශයෙන් කොටස් දෙකක් යටතේ සංවිධානය කෙරේ.

### 01. ප්‍රාදේශීය මාධ්‍ය වැඩමුළු -

දිස්ත්‍රික් මට්ටමින් පවත්වනු ලබන ප්‍රාදේශීය මාධ්‍ය වැඩමුළු සඳහා දෙපාර්තමේන්තු නිලධාරීන්, දිස්ත්‍රික් ලේකම්/ දිසාපතිවරුන්, සම්පත්දායකයින්, ආරාධිත අමුත්තන්, දිස්ත්‍රික් මාධ්‍ය ඒකක නිලධාරීන් හා ප්‍රාදේශීය මාධ්‍යවේදීන් සහභාගී වේ. මෙම වැඩමුළුවලදී දිස්ත්‍රික් සංවර්ධන ව්‍යාපෘති පිළිබඳව දිස්ත්‍රික් ලේකම්/ දිසාපතිවරුන් අදහස් පළ කරනු ලබයි. ප්‍රවීන දේශක මඩුල්ලක් සහභාගී කර ගනිමින් මාධ්‍යවේදීන් දැනුවත් කිරීම සිදු කරන අතර සාකච්ඡා වටය තුළින් ඔවුන්ගේ ගැටලු පිළිබඳව සාකච්ඡා කෙරේ.

2018 වර්ෂයේ අංශය ක්‍රියාකාරීත්වය ආරම්භ වීමත් සමඟ පහත සඳහන් පරිදි ප්‍රාදේශීය මාධ්‍ය වැඩමුළු පවත්වා ඇත.

### 01. ප්‍රාදේශීය මාධ්‍ය වැඩමුළුව - මොනරාගල දිස්ත්‍රික්කය

- පැවැත්වූ දිනය - 2018.08.27
- ස්ථානය - මොනරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය
- සහභාගි වූ දේශක මඬුල්ල - මොනරාගල දිස්ත්‍රික් ලේකම්/ දිසාපති, ඩී.එස්.පද්මකුලසූරිය මහත්මිය
  ලේක්හවුස් ආයතනයේ අධ්‍යක්ෂ, චන්ද්‍රසිරි සෙනෙවිරත්න මහතා
- සහභාගි වූ මාධ්‍යවේදීන් ගණන - 45





## 02. ප්‍රාදේශීය මාධ්‍ය වැඩමුළුව - අම්පාර දිස්ත්‍රික්කය

| | | | |
|---|---|---|---|
| ❖ | පැවැත්වූ දිනය | - | 2018.08.10 |
| ❖ | ස්ථානය | - | අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය |
| ❖ | සහභාගි වූ දේශක මඩුල්ල | - | අම්පාර දිස්ත්‍රික් ලේකම්/ දිසාපති, ඩී.එම්.එල්.බණ්ඩාරනායක මහතා<br>රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ (පාලන), නිර්මලී ප්‍රියංගනී කුමාරගේ මෙනවිය<br>ජාතික තොරතුරු මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ, නීතිඥ ජගත් ලියනාරච්චි මහතා<br>දෙසතිය සඟරාවේ උපදේශක, රාජා උස්වැටකෙයියාව මහතා |
| ❖ | සහභාගි වූ මාධ්‍යවේදීන් ගණන | - | 78 |









## 03. ප්‍රාදේශීය මාධ්‍ය වැඩමුළුව - බදුල්ල දිස්ත්‍රික්කය

- ❖ පැවැත්වූ දිනය - 2018.09.11
- ❖ ස්ථානය - බදුල්ල Grand Regency Hotel
- ❖ සහභාගි වූ දේශක මඬුල්ල - බදුල්ල දිස්ත්‍රික් ලේකම්/ දිසාපති, දමයන්ති පරණගම මහත්මිය
  රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ (පාලන), නිර්මලී ප්‍රියංගනී කුමාරගේ මෙනවිය
  ජනමාධ්‍ය විද්‍යාලයේ අධ්‍යක්ෂ, ජ්‍යෙෂ්ඨ මාධ්‍යවේදී ෂාන් විජේතුංග මහතා
  දෙසතිය සභරාවේ උපදේශක, රාජා උස්වැටකෙයියාව මහතා
- ❖ සහභාගි වූ මාධ්‍යවේදීන් ගණන - 51









## 04. ප්‍රාදේශීය මාධ්‍ය වැඩමුළුව - මහනුවර දිස්ත්‍රික්කය

- ❖ පැවැත්වූ දිනය - 2018.10.09
- ❖ ස්ථානය - මහනුවර ඩෙවෝන් හෝටලය
- ❖ සහභාගි වූ දේශක මඬුල්ල - මහනුවර දිස්ත්‍රික් ලේකම්/ දිසාපති, එල්.ජේ.එම්.ජී.චන්ද්‍රසිරි බණ්ඩාර මහතා

රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ
අධ්‍යක්ෂ (පාලන),
නිර්මලී ප්‍රියංගනී කුමාරගේ මෙනවිය
ජනමාධ්‍ය විද්‍යාලයේ අධ්‍යක්ෂ, ජ්‍යෙෂ්ඨ
මාධ්‍යවේදී ෂාන් විජේතුංග මහතා
දෙසතිය සඟරාවේ උපදේශක, රාජා
උස්වැටකෙයියාව මහතා

❖ සහභාගි වූ මාධ්‍යවේදීන් ගණන - 94









## 05. ප්‍රාදේශීය මාධ්‍ය වැඩමුළුව - වවුනියාව දිස්ත්‍රික්කය

- ❖ පැවැත්වූ දිනය - 2018.09.29
- ❖ ස්ථානය - වවුනියාව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය
- ❖ සහභාගි වූ දේශක මඬුල්ල - වවුනියාව අතිරේක දිස්ත්‍රික් ලේකම්, ටී.තිරේෂ් කුමාර් මහතා<br>රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්, නීතිඥ සුදර්ශන ගුණවර්ධන මැතිතුමා,<br>රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ (පාලන), නිර්මලී ප්‍රියංගනී කුමාරගේ මෙනවිය<br>නීතිඥ අයි.එච්.ආර්.නිරංජන් මහතා<br>දෙසතිය සඟරාවේ උපදේශක, රාජා උස්වැටකෙයියාව මහතා
- ❖ සහභාගි වූ මාධ්‍යවේදීන් ගණන - 94

ප්‍රාදේශීය මාධ්‍යවේදීන් සඳහා ඉදිකළ ප්‍රථම ආදර්ශ ගම්මානය වවුනියාව දිස්ත්‍රික්කයේ ඉදි කෙරෙමින් පවතී. එයට මුල්ගල තැබීමේ උත්සවය මෙදින උදෑසන රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්, නීතිඥ සුදර්ශන ගුණවර්ධන මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වුණි.

තවද වවුනියාව දිස්ත්‍රික් මාධ්‍ය ඒකකයට හිමිව තිබූ මුද්‍රණ යන්ත්‍ර කට්ටලය නිරීක්ෂණය කිරීම ද මෙහිදී සිදු කෙරිණි.













## 06. ප්‍රාදේශීය මාධ්‍ය වැඩමුළුව - මඩකලපුව දිස්ත්‍රික්කය

| | | | |
|---|---|---|---|
| ❖ | පැවැත්වූ දිනය | - | 2018.10.27 |
| ❖ | ස්ථානය | - | මඩකලපුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය |
| ❖ | සහභාගි වූ දේශක මඩුල්ල | - | මඩකලපුව දිස්ත්‍රික් ලේකම්/ දිසාපති,<br>එම්.උදය කුමාර් මහතා<br>රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ<br>අධ්‍යක්ෂ (පාලන),<br>නිර්මලී ප්‍රියංගනී කුමාරගේ මෙනවිය<br>නීතිඥ මොහොමඩ් අෂාඩ් මහතා<br>දෙසතිය සහරාවේ උපදේශක, රාජා<br>උස්වැටකෙයියාව මහතා |
| ❖ | සහභාගි වූ මාධ්‍යවේදීන් ගණන | - | 52 |

## 02. පාසල් මාධ්‍ය වැඩමුළු -

රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව හා දිස්ත්‍රික් මාධ්‍ය ඒකක මගින් දිස්ත්‍රික් මට්ටමින් පාසල් කිහිපයක් සම්බන්ධ කර ගනිමින් පාසල් ජනමාධ්‍ය වැඩමුළු පැවැත්වුණි. ප්‍රවීන දේශක මඩුල්ලක් සම්බන්ධ කර ගනිමින්, විශේෂයෙන් ජනමාධ්‍ය විෂය හදාරනු ලබන පාසල් සිසුන්ගේ ජනමාධ්‍ය සාක්ෂරතාවය ඉහළ නැංවීම මෙහි අරමුණ විය.

එලෙස පැවැත්වූ පාසල් මාධ්‍ය වැඩසටහන් පහත ඉදිරිපත් කර ඇත.

### 01. මඩකලපුව දිස්ත්‍රික් පාසල් ජනමාධ්‍ය වැඩමුළුව

| | | |
|---|---|---|
| දිනය | - | 2018.10.04 |
| ස්ථානය | - | මඩකලපුව මහජන විද්‍යාලය |

### 02. ගම්පහ දිස්ත්‍රික් පාසල් ජනමාධ්‍ය වැඩමුවව

| | | |
|---|---|---|
| දිනය | - | 2018.10.12 |

| | | |
|---|---|---|
| ස්ථානය | - | ගම්පහ බණ්ඩාරනායක විද්‍යාලය |
| සහභාගී වූ දේශක මඩුල්ල | - | ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ මහාචාර්ය ප්‍රනීත් අබේසුන්දර මහතා<br>ජනමාධ්‍ය විද්‍යාලයේ අධ්‍යක්ෂ ජ්‍යෙෂ්ඨ මාධ්‍යවේදී ෂාන් විජේතුංග මහතා |

ගම්පහ බණ්ඩාරනායක විද්‍යාලයේ X බෑන්ඩ් වාර්ෂික ප්‍රදර්ශනයට සමගාමීව පැවැත්වුණු පාසල් ජනමාධ්‍ය වැඩමුළුව සඳහා රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්, නීතිඥ සුදර්ශන ගුණවර්ධන මැතිතුමා ඇතුළු දෙපාර්තමේන්තු නිලධාරීන් හා ගම්පහ දිස්ත්‍රික් මාධ්‍ය ඒකක නිලධාරීන් සහභාගී විය.

### 03. මහනුවර දිස්ත්‍රික් පාසල් ජනමාධ්‍ය වැඩමුළු

| | | | |
|---|---|---|---|
| I. | දිනය | - | 2018.10.12 |
| | ස්ථානය | - | පිළිමතලාව ධීරානන්ද විද්‍යාලය |
| II. | දිනය | - | 2018.10.30 |
| | ස්ථානය | - | මහනුවර ස්වර්ණමාලි විද්‍යාලය |

### 04. බදුල්ල දිස්ත්‍රික් පාසල් ජනමාධ්‍ය වැඩමුළු

| | | | |
|---|---|---|---|
| I. | දිනය | - | 2018.10.22 |
| | ස්ථානය | - | බදුල්ල සයිමන් පීරිස් නගර ශාලාව |
| II. | දිනය | - | 2018.10.29 |
| | ස්ථානය | - | මහියංගන ප්‍රාදේශීය ලේකම් කාර්යාලීය ශ්‍රවනාගාරය |
| III. | දිනය | - | 2018.11.01 |
| | ස්ථානය | - | බණ්ඩාරවෙල ධර්මාශෝක විද්‍යාලයීය ශ්‍රවනාගාරය |

## 10. මාධ්‍ය හැඳුනුම්පත් අංශය

මෙම දෙපාර්තමේන්තුව විසින් ලබා දෙන සෘජු සේවාවක් වන මාධ්‍ය ක්ෂේත්‍රයේ නිරතවන්නන් වෙත මාධ්‍ය හැඳුනුම්පත් ලබා දීම මෙම අංශය යටතේ සිදු කෙරේ. මෙහිදී දේශීය මාධ්‍යවේදීන් මෙන්ම විදේශීය මාධ්‍ය ආයතන නියෝජනය කරමින් මෙරට රැඳී සිටින විදේශීය මාධ්‍යවේදීන්ටද සේවාව ලබා දීමට කටයුතු කරයි. දේශීය මාධ්‍යවේදීන් ආයතනික, ප්‍රාදේශීය පමණක් නොව වෙබ් මාධ්‍යවේදීන් ලෙසද වර්ග කෙරෙන අතර වෙබ් මාධ්‍යවේදීන්ව ජනමාධ්‍ය අමාත්‍යාංශය යටතේ වන ලියාපදිංචිය සලකා බලා මාධ්‍ය හැඳුනුම්පත් නිකුත් කිරීමට කටයුතු කරනු ලබයි.

සිය වෘත්තීය අනන්‍යතාව වෙනුවෙන් මාධ්‍ය හැඳුනුම්පත මහෝපකාරී වන නිසාම එය ලබා ගැනීමට මාධ්‍යවේදීන් තුළ දැඩි උනන්දුවක් පවතින බව නොරහසකි.

මාධ්‍ය ආයතන ප්‍රධානීන්ගේ නිර්දේශය මත රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්ගේ අත්සනින් ලබා දෙන මෙම මාධ්‍ය හැඳුනුම්පත් හා ඇඳුනු සියළු කොන්දේසි හා ක්‍රමවේදය පිළිබඳව ගැසට් මගින් ජනතාව දැනුවත් කෙරෙන අතර ඒ අනුව කාලානුරූපීව හා අවශ්‍යතාව සළකා බලා අදාල සංශෝධනයන් සිදු කරනු ලබයි.

මෙහිදී ආයතනගත විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය මාධ්‍යවේදීන් වෙත වාර්ෂික පදනමක් මත ද ප්‍රාදේශීය මාධ්‍යවේදීන් වෙත ද්වී වාර්ෂිකව ද මාධ්‍ය හැඳුනුම්පත් නිකුත් කෙරේ.

විදේශීය මාධ්‍යවේදීන් වෙනුවෙන් මාධ්‍ය හැඳුනුම්පත් නිකුත් කිරීමේදී විදේශ කටයුතු අමාත්‍යාංශයේ එකඟතාවය ද සළකා බලන අතර අවශ්‍යතාවක් වේ නම් ඔවුන් සේවය කරන විදේශීය මාධ්‍ය ආයතනයන්ගෙන්ද අන්තර්ජාලය හරහා එම හඳුනාගැනීම සිදු කිරීමට දෙපාර්තමේන්තුවේ මාධ්‍ය හැඳුනුම්පත් අංශයේ කාර්ය මණ්ඩලය උත්සුක වේ.

2018 වර්ෂයේ මාධ්‍යවේදීන් සඳහා මාධ්‍ය හැඳුනුම්පත් 6,276ක් සහ විශේෂ අවස්ථාවන්වලදී තෝරාගත් මාධ්‍යවේදීන් වෙනුවෙන් මාධ්‍ය හැඳුනුම්පත් 472ක් වශයෙන් මාධ්‍ය හැඳුනුම්පත් නිකුත් කර ඇත.

## 11. රජයේ ප්‍රකාශන කාර්යාංශය

රජයේ ප්‍රකාශන ජනතාව වෙත ගෙන යාම පිණිස රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව යටතේ ආරම්භයේ සිටම පවත්වාගෙන යන ලද ඒකකයක් ලෙස රජයේ ප්‍රකාශන කාර්යාංශය හැඳින්විය හැක.

ඒ අනුව , රජයේ ගැසට් නිවේදන, පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන පනත් කෙටුම්පත්, අනුමත වූ විවිධ අණපනත්, හැන්සාඩ් වාර්තා, වෙනත් රජයේ ප්‍රකාශන සහන මිලකට මිලදී ගත හැකි ස්ථානයක් ලෙස මෙය පවත්වාගෙන යන ලදී.

දැනට පොල්හේන්ගොඩ, කොළඹ 05 ලිපිනයේ ප්‍රධාන කාර්යාලය හා ගාල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පවත්වාගෙන යනු ලබන ශාඛා කාර්යාලයකින් පමණක් සමන්විත වුවද මෙහි කළකට ඉහත දිස්ත්‍රික් මට්ටමින් ශාඛා අලෙවි සැල් ජාලයක් ක්‍රියාත්මකව පැවතුනි. විවිධ ප්‍රතිපත්ති තීරණ මත මෙම තත්ත්වය වෙනස් වී තිබුනද මහජනතාව බොහෝ පිරිසක් සිය අවශ්‍යතා සපුරා ගැනීමට මෙම කාර්යාංශයේ සේවාව අපේක්ෂා කරයි.

කාර්යාංශයේ දෛනික අලෙවියෙන් ලැබෙන මුදලින් කොටසක් රජයේ මුද්‍රණාලයට නැවත බැර කෙරෙන අතර ඉතිරිය ඒකාබද්ධ අරමුදලට බැර කෙරේ. තවද මේ වන විට රජයේ මුද්‍රණාලය විසින් ද වෙනම සිය මුද්‍රණ අලෙවි කිරීමේ අලෙවි කවුළුවක් පවත්වාගෙන යාම හේතුවෙන් තවදුරටත් රජයේ ප්‍රකාශන කාර්යාංශය පවත්වාගෙන යාම පිළිබඳව යලි සලකා බැලීමට සිදු වන පරිසරයක් නිර්මාණය වෙමින් පවතී.

කෙසේ වෙතත් ශ්‍රී ලංකාව තුල බලපවත්නා නීති, රෙගුලාසි පාර්ලිමේන්තු විවාද හා උසාවි නියෝග පිළිබඳව මහජනතාව දැනුවත් කිරීමේ මූලික අරමුණ පදනම් කරගත් මෙම අංශය මඟින් ඒවා ඉල්ලුම පරිදි මුද්‍රණය කිරීම, ගබඩා කිරීම හා අලෙවිය පහත පරිදි 2018 වර්ෂයේදී දීපව්‍යාප්තව රටපුරා සිදු කර ඇත.

| දිනය | ස්ථානය | සිදු කළ කාර්යය | ප්‍රකාශන අලෙවි වටිනාකම<br>රු. | කාර්යභාරය හා මහජනතාවට වැදගත් වූ ආකාරය |
|---|---|---|---|---|
| 2018.06.30 සිට<br>2018.07.01 දක්වා | කෝට්ටේ මහ නගර සභා පරිශ්‍රයේ ප්‍රදර්ශනය | ප්‍රදර්ශන භූමියට පැමිණි | 76,728.50 | ප්‍රදර්ශන භූමියට පැමිණි බොහෝ පිරිසකගේ පනත් |

| | | | | |
|---|---|---|---|---|
| | | පාරිභෝගිකයින්ට සේවා සැපයීම | | හා ප්‍රකාශන අවශ්‍යතා සපුරාලීමට හැකි විය |
| 2018.08.29 සිට 2018.08.31 දක්වා | මොණරාගල පැවති "Enterprise Sri Lanka" ප්‍රදර්ශනය | ප්‍රදර්ශන භූමියට පැමිණි පාරිභෝගිකයින්ට සේවා සැපයීම | 144,686.00 | ශ්‍රී ලංකාවේ දුෂ්කර ප්‍රදේශවල සිටින ජනතාවට කොළඹට නොපැමිණ තමන්ට අවශ්‍ය ප්‍රකාශන ලබා ගැනීමට අවස්ථාව සැලසීමට හැකි විය |
| 2018.10.10 සිට 2018.10.14 දක්වා | ගම්පහ බණ්ඩාරනායක විද්‍යාලයේ "x - ban" ප්‍රදර්ශනය | ගම්පහ සහ ඒ අවට පාරිබෝගිකයින්ට සේවා සැපයීම | 92,735.00 | ප්‍රදර්ශන භූමියට පැමිණි බොහෝ පිරිසකගේ පනත් හා ප්‍රකාශන අවශ්‍යතා සපුරාලීමට හැකි විය |

## ගාල්ල දිස්ත්‍රික් අලෙවි අංශය

| | | | | |
|---|---|---|---|---|
| 2018.01.01 සිට 2018.12.31 දක්වා | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - ගාල්ල | ගාල්ල දිස්ත්‍රික්කය හා ඒ අවට ජනතාවට සේවා සැපයීම | 141,722.25 | කොළඹට නොපැමිණ දකුණු පළාතේ ජනතාවට අවශ්‍ය ප්‍රකාශන ලබා ගැනීමට හැකි වීම |

## කොළඹ ප්‍රධාන කාර්යාලයේ අලෙවි අංශය

| | | | | |
|---|---|---|---|---|
| 2018.01.01 සිට 2018.12.31 දක්වා | පොල්හේන්ගොඩ ප්‍රධාන අලෙවි අංශය | ප්‍රකාශන ලබා ගැනීමට කොළඹට පැමිණෙන ජනතාවට සේවා සැපයීම | 7,540,095.95 | - |

ඉහතින් සඳහන් කරන ලද කාර්යභාරය ඉටු කිරීම දෙපාර්තමේන්තුවේ දැක්ම හා මෙහෙවර ප්‍රමුඛත්වයෙහිලා සිදු කළ අතර, ඊට අදාළ අරමුණුවලට උචිත පරිදි කාර්ය දර්ශකයන් හඳුනාගන්නා ලදි. මේ හේතුවෙන් 2017 වසරේදී මෙන්ම තවදුරටත් අගයයන් ඊට එකතු කරමින් අදාළ කාර්යයන් ඉටු කිරීමට 2018 වසරේදී දෙපාර්තමේන්තුව යත්න දරණ ලද අතර, එය සාර්ථක වූ බව ද විශ්වාස කරන්නෙමු. ඒ සඳහා එවකට පැවති අමාත්‍යාංශය වූ මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයෙන් ලැබුණු මඟ පෙන්වීම ද සිහිපත් කළ යුතුව ඇත.

මෙතෙක් සිදු කළ කාර්යයන් මෙන්ම නව ප්‍රවණතාවයන් ද හඳුනා ගනිමින් හා ඊට අනුගත වෙමින් 2019 වසරේදී ද යහපත් මාධ්‍ය සංස්කෘතියක් ස්ථාපිත කිරීමේ දෙපාර්තමේන්තු දැක්ම යථාර්ථයක් බවට පත් කිරීම රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ ප්‍රමුඛතම අභිලාශයයි !

**රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව,**
අංක. 163, කිරුළපන ඇවනිව්, පොල්හේන්ගොඩ, කොළඹ 05.

**அரசாங்க தகவல் திணைக்களம்**
இல. 163, கிருலப்பனை அவனியூ, பொல்ஹேன்கொட, கொழும்பு 05.

**Department of Government Information**
No. 163, Kirulapone Avenue, Polhengoda, Colombo 05.

www.dig.gov.lk www.news.lk